අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2025

# 23 - දේශපාලන විද්‍යාව

## ලකුණු බෙදීයාම

---

**I පත්‍රය**

A සහ B යනුවෙන් කොටස් 02කි.

**<u>I පත්‍රය A කොටස</u>**

**කාලය පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 30කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 60 කි.**

**<u>I පත්‍රය B කොටස</u>**

කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් **මුළු ලකුණු 40 කි.**

I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**II පත්‍රය**

**කාලය පැය 03 යි.**

මෙම ප්‍රශ්න පත්‍රය I, II, III යනුවෙන් කොටස් 03කින් යුක්ත ය.

I වැනි කොටසින් අවම වශයෙන් <u>එක්</u> ප්‍රශ්නයක් ද, II වැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න <u>දෙකක්</u> ද, III වැනි කොටසින් අවම වශයෙන් <u>එක්</u> ප්‍රශ්නයක් ද වන සේ, ප්‍රශ්න 05කට පිළිතුරු ලිවිය යුතුය.

I කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 04කි.

III කොටස - අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න 03කි.

**II පත්‍රය සඳහා මුළු ලකුණු 100 කි.**

**අවසාන ලකුණු ගණනය කිරීම:** **I පත්‍රය= 100**

**II පත්‍රය= 100**

**අවසාන ලකුණ = 200 ÷ 2 =100**



Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2025

| විෂය අංකය<br>பாட இலக்கம் | 23 | විෂයය<br>பாடம் | දේශපාලන විද්‍යාව |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 1 | 21. | 1 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 |
| 03. | 1 | 13. | 1 | 23. | 5 |
| 04. | 4 | 14. | 5 | 24. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 1 |
| 06. | 1 | 16. | 4 | 26. | 5 |
| 07. | 5 | 17. | 4 | 27. | 2 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 |
| 09. | 2 | 19. | 3 | 29. | 3 |
| 10. | 4 | 20. | 1 | 30. | 4 |

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்
අවසාන ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 30 = 60



Scanned with CamScanner

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## B කොටස

**31.** ප්‍රමුඛ ග්‍රීක දේශපාලන චින්තකයින් **දෙදෙනෙකු** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**32.** පුරවැසියන්ගේ දේශපාලන කාර්යයන් **දෙකක්** දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**33.** දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය වර්ධනය කිරීමට දායක වූ ප්‍රමුඛ චින්තකයන් **දෙදෙනෙකු** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**34.** රාජ්‍ය පිළිබඳව ලිබරල් දේශපාලන න්‍යාය ප්‍රභේද තුනක් ඔස්සේ විකාශනය වී තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**35.** ස්ත්‍රීවාදයේ ආකාර/සම්ප්‍රදායන් කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**36.** ඒකීය රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ **දෙකක්** දක්වන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................

**37.** (1) ඔබ අධ්‍යයනය කර ඇති රටවල් පහෙහි ව්‍යවස්ථාමය ක්‍රම අතුරෙන් අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් පවතින්නේ කුමන රටෙහි ද?

..............................................................................................

(2) ඔබ අධ්‍යයනය කර ඇති රටවල් පහ අතුරෙන් වඩාත් ම බලවත් දෙවන මන්ත්‍රණ සභාවට උදාහරණයක් දෙන්න.

..............................................................................................

**38.** ප්‍රංශයේ උප ජාතික ආණ්ඩු ස්ථර තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..............................................................................................

(2) ..............................................................................................



Scanned with CamScanner

39. ගැටුමේ කාර්යයන් තේරුම් ගැනීමට ප්‍රවේශ දෙකක් තිබේ. ඒවා නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

40. ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයින් දෙදෙනෙකු සිටී. ඒවා නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

41. ඉන්දියාවේ මධ්‍යම සහ ප්‍රාන්ත රාජ්‍යයන් අතර ව්‍යවස්ථාදායක බලතල වෙන්කොට දැක්වෙන ලැයිස්තු තුනක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

42. 1833 ලංකාවේ කෝල්බෲක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සභා දෙකක් ස්ථාපිත කරන ලදී. ඒවා නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

43. කෲව්-මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ අලුතින් පිහිටුවන ලද උගත් ලාංකික මැතිවරණ කොට්ඨාශය සඳහා 1912 වර්ෂයේ දී පැවැති පළමු මැතිවරණයට අපේක්ෂකයින් දෙදෙනෙකු තරග කළෝ ය. ඔවුන් නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

44. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ආණ්ඩුවේ ප්‍රධාන කාර්යයන් දෙකක් රාජ්‍ය මන්ත්‍රණ සභාව තුළ ඒකාබද්ධ කරන ලදී. එම කාර්යයන් මොනවා ද?

(1) ..................................................................................................

(2) ..................................................................................................

45. 1947 වර්ෂයේ දී ලංකාවේ පළමු පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන විට රට තුළ දේශපාලන පක්ෂ කිහිපයක් තිබුණි. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ..................................................................................................

(2) ..................................................................................................

46. (1) 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්කරලීමට අනුමැතිය ලබා දෙන ලද්දේ කවුරුන් විසින් ද?

..................................................................................................

(2) 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්කළ සහතිකය අනුමත කළේ කවුරුන් ද?

..................................................................................................



Scanned with CamScanner

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## B කොටස

31. ප්ලේටෝ

ඇරිස්ටෝටල්

සොක්‍රටිස්

~~පොලිබියස්~~

32. දේශපාලන කටයුතුවල යෙදීම

ඡන්ද ප්‍රකාශ කිරීම

දේශපාලන පක්ෂවල සාමාජිකයන් වීම

දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම

එදිනෙදා දේශපාලන කටයුතු කෙරෙහි උනන්දුවක් දැක්වීම

33. ඇඩම් ස්මිත්

ඩේවිඩ් රිකාඩෝ

ජෝන් ස්ටුවර්ට් මිල්

තෝමස් රොබර්ට් මැල්තූස්

කාල් මාර්ක්ස්

34. සම්භාව්‍ය ලිබරල්වාදය /

නූතන ලිබරල්වාදය/ පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය

නව ලිබරල්වාදය

35. ලිබරල් ස්ත්‍රීවාදය

පශ්චාත් නූතන ස්ත්‍රීවාදය

පශ්චාත් යටත් විජිත ස්ත්‍රීවාදය

සමාජවාදි ස්ත්‍රීවාදය

පශ්චාත් නූතන ස්ත්‍රීවාදය

36. රාජ්‍යයේ ස්වාධිපති බලය තනි ජාතික අධිකාරියකට පැවරීම

මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරත්වය

නීතියේ සහ පරිපාලනයේ ඒකාකාරී බව

ඒකීය පුරවැසිභාවය

පාලනයේ කාර්‍යක්ෂමතාව සහ පරිපාලනයේ සරල බව



Past Papers Wiki
Scanned with CamScanner

37. 1. ප්‍රංශය

2. අමෙරිකා එක්සත් ජනපදය

38. කලාප

දෙපාර්තමේන්තු (කලාපවල කුඩා ප්‍රාදේශීය ඒකක)

කොමියුන (ප්‍රජා ඒකක) හෙවත් පලාත් පාලන ආයතන

39. සාධනීය ප්‍රවේශය/ සාධනීය පැතිකඩ

නිශේධනීය ප්‍රවේශය / නිශේධනීය පැතිකඩ

40. ජාතික රාජ්‍යයන්

රාජ්‍ය නොවන ක්‍රියාධරයන්

41. මධ්‍යම ලැයිස්තුව

ප්‍රාන්ත ලැයිස්තුව

සමගාමී ලැයිස්තුව

42. ව්‍යවස්ථාදායක සභාව

විධායක සභාව

43. මාර්කස් ප්‍රනාන්දු

පොන්නම්බලම් රාමනාදන්

44. ව්‍යවස්ථාදායක කාර්යයන්

විධායක කාර්යයන්

45. ලංකා සමසමාජ පක්ෂය

ලංකා කොමියුනිස්ට් පක්ෂය

එක්සත් ජාතික පක්ෂය

කම්කරු පක්ෂය

ලංකා ඉන්දියානු කොංග්‍රසය

සමස්ථ ලංකා ද්‍රවිඩ සංගමය

බෝල්ෂෙවික් ලෙනිනිස්ට් පක්ෂය

එක්සත් ලංකා කොංග්‍රසය

ස්වරාජ් පක්ෂය



Scanned with CamScanner

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

46. 1. අග්‍රාණ්ඩුකාරවරයා / [illegible]

2. කතානායකවරයා

47. 1. 19 වන ව්‍යවස්ථා සංශෝධනය

2. 18 වන ව්‍යවස්ථා සංශෝධනය

48. අගමැති සහ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවේ සාමාජිකයන් වීම

අගමැති සහ ඇමති මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකීම සහ උත්තර දීම

අගමැති සහ ඇමතිවරු සිය ධුර දැරීම සඳහා පාර්ලිමේන්තුවේ විශ්වාසය පවත්වා ගැනීම

පාර්ලිමේන්තු සාමාජිකයන්ට අගමැති සහ ඇමතිවරුන්ගෙන් පාර්ලිමේන්තුවේ දී ප්‍රශ්න ඇසීමට හැකිවීම

[illegible]

49. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / IMF

ලෝක බැංකුව (WB)

ආසියානු සංවර්ධන බැංකුව

WTO ([illegible])

50. රාජ්‍යතාන්ත්‍රිකභාවය

විදේශ ආධාර

හමුදා බලය



Scanned with CamScanner

## 1 කොටස

**1. දේශපාලන විද්‍යාවේ පහත සඳහන් ඕනෑම උප ක්ෂේත්‍ර දෙකක් පිළිබඳ ව කෙටියෙන් සාකච්ඡා කරන්න.**

(i) දේශපාලන ආයතන
(ii) දේශපාලන න්‍යාය
(iii) දේශපාලන මතවාද
(iv) තුලනාත්මක දේශපාලනය (ලකුණු 10x 2 = 20)

**(i) දේශපාලන ආයතන**

- දේශපාලන ආයතන යනු දේශපාලන විද්‍යාවේ මූලික උප ක්ෂේත්‍රයකි. එය බලය ක්‍රියාත්මක කරන සහ සාමූහික තීරණ ගනු ලබන ව්‍යුහයන්', නීති රීති සහ සංවිධාන පිළිබඳව අධ්‍යයනය කරයි.
- මෙම උප ක්ෂේත්‍රයෙන් අවධානය යොමු කරනු ලබන්නේ දේශපාලන ආයතන විසින් දේශපාලන චර්යාව හැඩගස්වන්නේ කෙසේ ද? තීරණ ගැනීමේ ක්‍රියාවලියට බලපෑම් කරන්නේ කෙසේ ද? සහ දේශපාලන ක්‍රමයක් පවත්වා ගෙන යන්නේ කෙසේ ද? යන්න කෙරෙහි ය.
- දේශපාලන ආයතනවල ස්වභාවය සහ ක්‍රියාකාරිත්වය මත පදනම් ව දේශපාලන ආයතන විධිමත් සහ අවිධිමත් ආයතන යනුවෙන් බෙදා දැක්විය හැකි ය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය මැතිවරණ යනාදිය අයත්වන්නේ විධිමත් ආයතන වලට ය. මේවා පිහිටුවනු ලබන්නේ සහ පාලනය කරනු ලබන්නේ ලිඛිත නීති වලට අනුව ය.
- මේ විධිමත් ආයතන මගින් දේශපාලන ක්‍රියාධරයන්ගේ බලතල, යුතුකම් සහ වගකීම් නිශ්චය කරන අතර පාලනය අරබයා නෛතික රාමුවක් සපයයි.
- අවිධිමත් ආයතන වලට සම්මතයන්, චාරිත්‍ර-චාරිත්‍ර, සම්ප්‍රදායන් සහ අවිධිමත් දේශපාලන භාවිතයන් අයත්වන අතර ඒවා විධිමත් නෛතික ව්‍යුහයන්ගෙන් පිටත තිබෙන චර්යාවන්ට බලපෑම් කරයි.
- අවිධිමත් දේශපාලන ආයතන නිරන්තරයෙන් ම විධිමත් ආයතන සමග ක්‍රියාත්මක වන අතර ඒවාට භාවිතය තුල දෙශපාලන ආයතන ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න කෙරෙහි සැළකිය යුතු බලපෑමක් කළ හැකි ය.
- දේශපාලන ආයතන පිළිබඳව හදාරන විද්වතුන්ට ආයතන සැළසුම් කරන්නේ කෙසේ ද? සහ ඒවා බලය බෙදා හරින්නේ කෙසේ ද? යන්න පිළිබඳවත් ඒවා සංවරණ සහ තුලනයන් ඇතුලත් කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳවත් විශ්ලේෂණය කළ හැකිය.
- කාලයත් සමග ආයතන වෙනස් වන ආකාරයත් එවැනි වෙනස්කම් දේශපාලන ස්ථාවරත්වයට බලපාන්නේ කෙසේ ද යන්නත් මෙම අධ්‍යයන ක්ෂේත්‍රයෙන පරීක්ෂා කරයි.
- දේශපාලන ආයතන පිළිබඳ තුලනාත්මක පර්යේෂණ මගින් විවිධ රටවල ආයතනික විධිවිධාන වෙනස් වන්නේ ඇයි ද යන්න සහ මෙම වෙනස්කම් පාලන පාලනතන්ත්‍ර වර්ග සහ ඒවායේ පාලන ධාරිතාවට බලපාන්නේ කෙසේ ද යන්න විශ්ලේෂණය කරයි.
- දේශපාලන ආයතන අධ්‍යයනය කිරීම වැදගත් ය. තුමක් නිසාද යත් දේශපාලන ක්‍රියාකාරකම් සංවිධානය කරන්නේ සහ මෙහෙය වන්නේ ආයතන රාමුව තුල වන බැවිනි. එමෙන්ම මැතිවරණ, නීති සම්පාදනය සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම වර්ධනය වන්නේ සහ මෙහෙය වන්නේ දේශපාලන ආයතන වටා වන බැවිනි.
- සමාජයේ ප්‍රධාන දේශපාලන ආයතන වලට රාජ්‍ය සහ ආණ්ඩුව, දේශපාලන පක්ෂ සහ බලපෑම් කණ්ඩායම්, සිවිල් සමාජ සංවිධාන අයත් වේ.
- සමස්ථයක් ලෙස්න් දේශපාලන ආයතන අධ්‍යයනය කිරීමෙන් දේශපාලන අධිකාරිය ක්‍රියාත්මක වන ආකාරය, දේශපාලන ක්‍රමය පවත්වා ගෙන යන ආකාරය සහ පුරවැසියන් සහ රාජ්‍යය අතර අන්තර් ක්‍රියාකාරිත්වය පිළිබඳ අත්‍යවශ්‍ය අවබෝධයක් ලබා දෙයි.



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## (ii) දේශපාලන න්‍යාය

* දේශපාලන න්‍යාය යනු දේශපාලන ජීවිතය සහ දේශපාලන ආයතන හැඩගස්වන අදහස්, සංකල්ප සහ ප්‍රතිමානිය මූලධර්ම ක්‍රමාණුකූලව පරීක්ෂා කරන දේශපාලන විද්‍යාවේ මූලික උප ක්ෂේත්‍රයකි.

* දේශපාලන න්‍යායේ මූලික ව අවධානය යොමු කරන්නේ පහත සඳහන් මූලික ප්‍රශ්න වලට ආමන්ත්‍රණය කිරීමට ය' එනම් යුක්තිය යනු කුමක් ද? එය ලඟා කරගත යුත්තේ කෙසේ ද? පුරවැසියන්ට හිමිවිය යුත්තේ කුමන අයිතිවාසිකම් සහ යුතුකම් ද?

* තුලනාත්මක දේශපාලනය හෝ ජාත්‍යන්තර සම්බන්ධතා වැනි ආනුභවික උපක්ෂේත්‍ර මෙන් නොව දේශපාලන න්‍යාය ආනුභවික විශ්ලේෂණ සමග සම්බන්ධ වුව ද ප්‍රධාන වශයෙන් ප්‍රතිමානිය විශ්ලේෂනය කෙරෙහි අවධානය යොමු කරයි.

* මෙම ක්ෂේත්‍රය පහත සඳහන් ප්‍රධාන සම්ප්‍රදායන් ආවරණය කරයි.

**සම්භාව්‍ය දේශපාලන න්‍යාය**

ප්ලේටෝ, ඇරිස්ටෝටල්, මැකියාවෙල්ලි සහ හොබ්ස් වැනි චින්තකයන් සම්බන්ධ සම්භාව්‍ය දේශපාලන න්‍යාය මගින් රාජ්‍ය, පුරවැසිභාවය සහ නීතිය වැනි ප්‍රධාන දේශපාලන සංකල්ප වලට පදනම දමන ලදි.

**නූතන සහ සමකාලීන දේශපාලන න්‍යාය**

මෙයට ලිබරල්වාදය, මාක්ස්වාදය, ප්‍රජාතන්ත්‍රවාදි න්‍යාය ඇතුලත් වන අතර ධනවාදය සහ අසමානාත්මතාවය වැනි නූතන අභියෝගයන්ට ප්‍රතිචාර දක්වයි.

- දේශපාලන න්‍යාය මූලික දේශපාලන පද (නිදහස, සමානාත්මතාවය, බලය සහ අධිකාරිය ) සඳහා සංකල්පීය පැහැදිලි බවක් ලබා දීමෙන් විෂය ක්ෂේත්‍රය තුල තීරණාත්මක කාර්ය භාරයක් ඉටු කරයි.
- දේශපාලන ආයතන සහ භාවිතයන් ඇගයීම සඳහා ප්‍රතිමානීය ප්‍රමිතීන් ඉදිරිපත් කිරීමෙන් දේශපාලන න්‍යාය විෂය ක්ෂේත්‍රය තුල තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි.
- පාලනය, යටත්විජිතවාදය, ප්‍රජාතන්ත්‍රවාදය සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විවාද හැඩ ගැස්වීමෙන් දේශපාලන න්‍යාය විෂය ක්ෂේත්‍රය තුල වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.
- පළල් ලෙස ින් දේශපාලන න්‍යාය ප්‍රධාන සණයේ න්‍යාත්මක ප්‍රවේශ දෙකක් ඇතුලත් කරගනී. එනම් ප්‍රතිමානීය න්‍යාය සහ විද්‍යාත්මක න්‍යාය (ආනුභවික න්‍යාය) යනුවෙනි.
- විසිවන සියවස තුල සහ සමකාලීන අවධිය තුල දේශපාලන න්‍යාය බහුවිධ න්‍යායාත්මක ප්‍රවේශයක් දක්වා පුළුල් වී තිබේ. මේවාට ලිබරල් සහ නව ලිබරල් න්‍යායන්, මාක්ස්වාදි සහ විශ්ලේෂණාත්මක න්‍යායන් සහ ස්ත්‍රීවාදි සහ යටත්විජිත න්‍යායන් ඇතුළත් ය.
- සමස්තයක් ලෙස ින් දේශපාලන න්‍යාය මගින් දේශපාලන විද්‍යාවේ බුද්ධිමය සහ දාර්ශනික කොඳු නාරටිය ශක්තිමත් කරයි.

## (iii) දේශපාලන මතවාද

දේශපාලන මතවාද යනු දිගු බුද්ධිමය ඉතිහාසයක් සහිතව දේශපාලන විද්‍යාවේ උප විෂයක් ලෙස ින් වඩාත් හොඳින් ස්ථාපිත වූවකි. එය අවධානය යොමු කරන්නේ දේශපාලන චින්තනය, චර්යාව සහ ආයතන හැඩ ගැස්වීමට බලපෑම් කරන අදහස් ක්‍රමාණුකූලව අධ්‍යයනය කිරීමට ය.

- දේශපාලන මතවාද යනු පුද්ගලයන් සහ කණ්ඩායම් දේශපාලන ලෝකය අර්ථකථනය කරන සහ සමාජ සහ දේශපාලන ජීවිතය සංවිධානය කිරීමට උත්සාහ කරන විශ්වාස, වටිනාකම් සහ අදහස් සමූහයකි.
- දේශපාලන මතවාද මගින් සමාජය, බලය, අධිකාරිය යනාදිය තේරුම් ගැනීම සඳහා සංකල්පීය කාචයක් සපයයි. එය, තවදුරටත් සමාජය සංවිධානය කල යුත්තේ කෙසේ ද? බලය බෙදාහැරිය යුත්තේ කෙසේ ද? සහ රාජ්‍ය හඹා යා යුත්තේ කවර ඉලක්ක ද යන්න පැහැදිලි කිරීම අරභයා සංකල්පීය රාමුවක් ලබා දෙයි.
- උප ක්ෂේත්‍රයක් ලෙස ින් දේශපාලන මතවාද පිළිබඳ මගින් පහත සඳහන් අංග පරීක්ෂා කරයි. එනම්,
    - දේශපාලන මතවාද වල ආරම්භය සහ ඓතිහාසික වර්ධනය
    - මූලික සංරචක සහ මතවාදි ක්‍රමයන් ගේ අභ්‍යන්තර ව්‍යූහය
    - දේශපාලන ක්‍රම, ආයතන සහ පාලනයන් තුල මතවාදයන්හි කාර්යභාරය
- දේශපාලන ක්‍රමයන් හැඩ ගැස්වීමේ දී දේශපාලන මතවාද තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි.
- දේශපාලන ආයතනවල නිර්මාණයට සහ එහි ක්‍රියාකාරිත්වයට බලපෑම් කරයි.



Scanned with CamScanner

- දේශපාලන පක්ෂ සහ දේශපාලන තරගය ව්‍යුහගත කරයි.
- රාජ්‍ය ප්‍රතිපත්තිවරණයට සහ දේශපාලන චර්යාවට මග පෙන්වයි.
- මතවාද සමාජ ඒකාබද්ධතාවයේ ආකාරයක් ලෙස ද ක්‍රියා කරන අතර, දේශපාලන ක්‍රම පවත්වා ගැනීමට උපකාරී වන වටිනාකම්, සම්මතයන් සහ සාමූහික අනන්‍යතා සමාජ කණ්ඩාය වලට ලබා දෙයි.
- ලිබරල්වාදය, සමාජවාදය, කොන්සවටිව්වාදය, සමාජවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, ෆැසිස්ට්වාද නව ලිබරල්වාදය, ජාතිකවාදය, ස්ත්‍රීවාදය, සහ පරිසරවාදය විවිධ ඓතිහාසික සහ භූගෝලී සංදර්භයන් ඔස්සේ දේශපාලන ක්‍රියාවලින් සහ ආයතන ඉතා බලගතු ලෙස'න් හැඩ ගස්වා ඇත

අවසාන වශයෙන් දේශපාලන මතවාද යනු හුදු අදහස් සමූහයක් පමණක් නොව සමාජයේ විශාල පිරිස බලගැන්වීමේ හැකියාව ඇති සහ දේශපාලන ව්‍යාපාර වලට සහ භාවිතයන්ට මග පෙන්වීමේ හැකිය ඇති දේශපාලන ජීවිතයේ බලගතු බලවේගයකි.

### (iv) තුලනාත්මක දේශපාලනය

- තුලනාත්මක දේශපාලනය දේශපාලන විද්‍යාවේ ප්‍රධාන උප ක්ෂේත්‍රයක් වන අතර ඉන් අවධාන යොමු කරන්නේ විවිධ සංදර්භයන් ඔස්සේ දේශපාලන ක්‍රම, ආයතනික ක්‍රියාකාරිත්වයන්, ස ක්‍රියාවලින් පිළිබඳ ආනුභාවික විශ්ලේෂණයක් කිරීම ය.
- තුලනාත්මක දේශපාලනය 1950 ගණන් වලදී බොහෝ දුරට ඇමරිකානු දේශපාලන විද්‍යාව තු සුවිශේෂී උප ක්ෂේත්‍රයක් ලෙස'න් මතු විය. එතැන් සිට එය ගෝලීය වශයෙන් පිළිගත් විද්ව විමර්ශන ක්ෂේත්‍රයක් බවට පත් විය.
- ප්‍රතිමානීය සහ දාර්ශනික ප්‍රශ්න ගැන අවධානය යොමු කරන දේශපාලන න්‍යාය මෙන් නො තුලනාත්මක දේශපාලනය සැබෑ ලෝක දේශපාලන සංසිද්ධි නිරීක්ෂනය කිරීමට සහ පැහැදි කිරීමට උත්සාහ කරයි.
- තුලනාත්මක දේශපාලනයේ කේන්ද්‍රීය අරමුන වනුයේ දේශපාලන සංසිද්ධීන් අතර සමානකම් ස වෙනස්කම් විශ්ලේෂණය කිරීමයි. මෙහිදී මෙවැනි ප්‍රශ්න මතු කරයි එනම්
  - දේශපාලන ක්‍රම වෙනස් වන්නේ කෙසේ ද?
  - මෙම වෙනස්කම් කෙතරම් දුරට වැදගත් ද?
  - ඒවා පැහැදිලි කරන සමාජ, ආර්ථික, ආයතනික හෝ ඓතිහාසික සාධක මොනවාද?
- තුලනාත්මක දේශපාලනය ප්‍රධාන විශ්ලේෂණාත්මක අරමුණු තුනක් ඉටු රයි.
  - විස්තර කිරීම
  - පැහැදිලි කිරීම
  - අනාවැකි පල කිරීම
- දේශපාලනය පිළිබඳ සාමාන්‍යකරණය කළහැකි දැනුමක් ලබා ගත හැක්කේ සිද්ධි වැඩි ගණන අධ්‍යයනය කිරීම මගින් පමණක් ය යන මූලධර්මය මත මෙම විෂය ක්ෂේත්‍රය රඳා පවතී.
- තුලනාත්මක විශ්ලේෂණයේ ප්‍රධාන ආකාර දෙකක් හඳුනාගත හැකිය.
  1. රටවල් කිහිපයක් අතර සිදු කැරෙන සංසන්දනය
  2. තනි රටක් තුල සිදු කැරෙන සංසන්දනය



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**2. "රාජ්‍යය යනු නිශ්චිත භෞමික දේශසීමා තුළ ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන උසස්ම දේශපාලන ආයතනයයි." සාකච්ඡා කරන්න.** (ලකුණු 20)

රාජ්‍යය සාමාන්‍යයෙන් අර්ථකතනය කරනු ලබන්නේ නිශ්චිතව දක්වා ඇති භෞමික සීමාවන් තුල සිටින ජනතාව කෙරෙහි ස්වාධිපති බලය ක්‍රියාත්මක කරන උත්තර දේශපාලන ආයතනය ලෙසිනි. රාජ්‍යය සළකනු ලබන්නේ උසස්ම දේශපාලන සංවිධානය ලෙසිනි. කුමක් නිසාද යත් එය අනෙකුත් සියලු සමාජ සහ දේශපාලන ආයතන වලට ඉහළින් සිටින අතර එය වෙනත් කිසිඳු සමාගකට හිමිකම් කිව නොහැකි බලයක් එය සතු කර ගන්නා බැවිනි. රාජ්‍යයේ සුවිශේෂ ලක්ෂණය වන්නේ එය සතු ස්වාධිපති බලයයි. එයින් රාජ්‍යයට අයත් දේශ සීමාව තුල එයට උත්තරීතර, පරම සහ නීතිඥානුකූල අසීමිත බලයක් අධිකාරියක් තිබෙන බව දක්වේ. පවුල්, ආගමික ආයතන, සමාගම් සහ සිවිල් සමාජ සංවිධාන ක්‍රියාත්මක වන්නේ රාජ්‍යය විසින් ස්ථාපිත කල නෛතික රාමුව තුල වන අතර ඒවා රාජ්‍යයට යටත්ව සිටී.

ඉහළ ම දේශපාලන ආයතනය ලෙසින් රාජ්‍යය නීතිඥානුකූල බලහත්කාරි බලය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඒකාධිකාරිය හිමිකර ගනී. පොලීසිය, සන්නද්ධ හමුදා සහ අධිකරණය යනාදි ආයතන තුලින් රාජ්‍යය තම නිතී වලට අනුකූල වීම සහතික කරන අතර නීතී උල්ලංඝණය කිරීම සඳහා දඬුවම් වන්නේ නැත. රාජ්‍යයේ තීරණවලට ජනතාව අනුගත වන්නේ ඒවා මහජන යහපතට සේවය කරන බව ප්‍රකාශ වන බැවිනි.

රාජ්‍යය භෞමික සංගමයකි. එහි අධිකාරිය භූගෝලීය වශයෙන් නිර්වචනය කරන ලද දේශ සීමාවලට සීමාවන අතර එම භූමියේ ජීවත් වන සියළුම පුද්ගලයන්ට එය අදාල වේ. එමෙන් ම එය අනිවාර්ය වේ. කුමක් නිසාද යත් එහි ජීවත්වන කිසිදු පුද්ගලයෙකුට එහි බලයට හසු නොවී සිටීමට නොහැකි වන බැවිනි. මේ ලක්ෂණ වලින් රාජ්‍යය සෙසු සියළු දේශපාලන සහ සමාජ සංවිධාන වලින් වෙන් කොට පෙන්වයි.

කෙසේ වෙතත් රාජ්‍යය පිළිබඳ මෙම සම්භාව්‍ය මතය වර්තමාන ලෝකය තුල අභියෝගයට ලක් වේ. ගෝලීයකරණය, අධිජාතික ආයතන, බහුජාතික සමාගම් සහ ත්‍රස්තවාදි ජාල වැනි රාජ්‍ය නොවන ක්‍රියාධරයන් විසින් රාජ්‍යයේ ස්වෛරීත්වය සීමා කර තිබෙන අතර ස්වාධිපති බලයේ සීමා මායිම් නොපැහැදිලි කර ඇත. ආර්ථික සහ නියාමන තීරණ රාජ්‍ය පාලනයෙන් ඔබ්බට ගිය බලවේගවල බලපෑම් වලට ලක්වීම වැඩි වැඩියෙන් සිදුවේ.

කෙසේ වුවද, මේ අභියෝග තිබියදීත් දේශපාලන ජීවිතය තුල රාජ්‍යය ප්‍රධාන ක්‍රියාධරයා වශයෙන් සිටී. එය සිය දේශ සීමාව තුල දේශපාලන අධිකාරිය නියෝජනය කරයි.

1. [illegible] [illegible]
2. [illegible]

[illegible]

1. [illegible]
2. [illegible]



Scanned with CamScanner

3. පහත සඳහන් ඕනෑම ආණ්ඩුක්‍රම දෙකක ප්‍රධාන ලක්ෂණ සාකච්ඡා කරන්න.
(i) ජනාධිපති ආණ්ඩුක්‍රමය
(ii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
(iii) අර්ධ ජනාධිපති (මිශ්‍ර) ආණ්ඩුක්‍රමය (ලකුණු 10 x 2 = 20)

(1) ජනාධිපති ආණ්ඩුක්‍රමය

ජනාධිපති ආණ්ඩුක්‍රමය දැඩි බලතල බෙදීමක් පදනම් වන අතර ආණ්ඩුවේ විධායක සහ ව්‍යවස්ථාදායක ශාඛා අතර පැහැදිලි වෙනසක් පවතී. මෙම ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දක්වේ.

- ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක සහ විධායක අංශ අතර විධිමත සහ ව්‍යවස්ථාමය බෙදීමක් පවතී. මේ එක් එක් ශාඛාවන් සිය අධිකාරි ක්ෂේත්‍රය තුල එකිනෙකින් ස්වාධීන ලෙස ක්‍රියාත්මක වේ.
- ආණ්ඩුවේ ව්‍යවස්ථාදායක සහ විධායක අංශ අතර විධිමත් සහ ව්‍යවස්ථාමය බෙදීමක් පවතී. මේ එක් එක් ශාඛාවන් සිය අධිකාරි ක්ෂේත්‍රය තුල එකිනෙකින් ස්වාධීන ලෙස්න් ක්‍රියාත්මක වේ.
- විධායක බලතල මුළුමනින්ම ජනාධිපතිවරයා වෙත පවරනු ලබයි. කැබිනට් සාමාජිකයන් ජනාධිපතිගේ උපදේශකයන් සහ පරිපාලකයන් ලෙස්න් ක්‍රියා කරයි. මේ කැබිනට් සාමාජිකයන් සාමුහිකවත් තනි තනිවත් ජනාධිපතිවරයාට පමණක් වගකියති.
- ජනාධිපතිවරයා ව්‍යවස්ථාපිතව ම පාර්ලිමේන්තුවට වග නොකියයි. එමෙන්ම ධූරයේ රැඳී සිටීම පිණිස ව්‍යවස්ථාදායකයේ විශ්වාසය අවශ්‍ය නොවේ.
- ජනාධිපතිවරයා නිශ්චිත නිල කාලයක් සඳහා සේවය කරන අතර දේශපාලන ක්‍රියාවලියක් ඔස්සේ ව්‍යවස්ථාදායකය විසින් ජනාධිපතිවරයාව ධූරයෙන් පහකල නොහැකි ය. ධූරයෙන් ඉවත් කිරීම කල හැක්කේ දෝෂාභියෝගය නැමැති සුවිශේෂී ව්‍යවස්ථාමය ක්‍රියාපටිපාටියක් මගින් පමණි.
- ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය විසුරුවා හැරීමේ බලය හිමි වන්නේ නැත. එලෙස ම ව්‍යවස්ථාදායකයට ද සාමාන්‍ය ආකාරයෙන් ජනාධිපතිවරයාව තනතුරින් පහකළ නොහැකි ය මේ දෙකෙහි ස්වාධීනත්වය ව්‍යවස්ථාමය ලෙස්න් ශක්තිමත් කර ඇත.
- රාජ්‍ය නායකත්වය සහ ආණ්ඩුවේ නායකත්වය යන තත්වයන් ජනාධිපති ධූරය තුල ගොනු කර තිබේ.

(ii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර පවතින සමීප සම්බන්ධතාවය පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයෙහි දක්නට ඇති මූලික ලක්ෂණයකි. විධායකය සිය අධිකාරිත්වය ලබා ගන්නේ ව්‍යවස්ථාදායකය තුලින් වන අතර එය පාර්ලිමේන්තුවට වගකිව යුතු ය. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත දක් වේ.

- ආණ්ඩුව පිහිටවනු ලබන්නේ පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵලයක් ලෙස්නි. ආණ්ඩු අධිකාරිය ගොඩ නැගෙන්නේ ව්‍යවස්ථාදායකයේ බහුතර පක්ෂයේ හෝ ව්‍යවස්ථාදයකයේ සභාගයකිනි.
- අගමැතිවරයා සහ කැබිනට් ඇමැතිවරු ඇතුලත් වන දේශපාලන විධායකයේ සාමාජිකයන් ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් වන බැවින් ව්‍යවස්ථාදායක සහ විධායක ශාඛාවන් අතර ආයතනික සම්බන්ධතාවයක් පවතී.
- ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ විශ්වාසය ඇති තාක් බලයේ සිටිය හැකි ය. විශ්වාස භංග යෝජනාවක් සම්මත කිරීම හේතුවෙන් ආණ්ඩුවට පාර්ලිමේන්තුවේ විශ්වාසය අහිමි වූ විට ආණ්ඩුව බලයෙන් ඉවත් විය යුතු ය.
- දේශපාලන විධායකය සාමුහිකව පාර්ලිමේන්තුවට වගකිව යුතු ය. සියළු ඇමැතිවරු කැබිනට් තීරණ වෙනුවෙන් පෙනී සිටිය යුතුය. ඒවා ප්‍රසිද්ධියේ ආරක්ෂා කල යුතු ය.
- බොහෝ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයන් තුල අගමැතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැර නව මැතිවරණයක් කැඳවීමේ බලය තිබේ.
- පාර්ලිමේන්තු විධායකය ක්‍රියාත්මක වන්නේ කැබිනට් ආණ්ඩුක්‍රම මූලධර්මය මත වන අතර එමගින් තනි පුද්ගලයෙකු අත බලය ඒකරාශීවීම වළක්වමින් සාමුහික තීරණ ගැනීම අවධාරණය කරයි.
- අගමැතිවරයා ආණ්ඩුවේ නායකයා වශයෙන් සැබෑ විධායක බලතල ක්‍රියාත්මක කරන අතර රාජ්‍යයේ නායකයා සංකේතාත්මක සහ ව්‍යවස්ථාමය වගකීම් ක්‍රියාවට නන්වයි.
- දේශපාලන විධායකයේ සාමාජිකයන් ගේ ධූරයෙහි වාර ගනනෙහි සීමාවක් නැත.



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

## (iii) අර්ධ ජනාධිපති (මිශ්‍ර) ආණ්ඩුක්‍රමය

අර්ධ ජනාධිපති ක්‍රමය ජනාධිපති සහ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමවල මූලික ලක්ෂණ වලින් සමන්විත වේ. එය ද්විත්ව විධායක ව්‍යූහයකින් යුක්ත වන අතර විධායක අධිකාරිත්වය ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අතර පංගුකර ගනී. එහි ප්‍රධාන ලක්ෂණ වලට පහත සඳහන් අංග ඇතුලත් ය.

- විධායක බලය ජනතාව විසින් සෘජුව තෝරා පත්කර ගත් ජනාධිපතිවරයෙකු සහ පාර්ලිමේන්තුවෙන් පත්කර ගත් අගමැති ඇතුළු ඇමැති මණ්ඩලයක් අතර බෙදී පවතී.
- ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව තෝරාපත් කරගනු ලබයි.
- අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය ව්‍යවස්ථාදායකයෙන් පත්වන අතර එය ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකිව යුතුය. එයට බලයේ සිටිය හැක්කේ පාර්ලිමේන්තුවේ විශ්වාසය ඇතිතාක් කල් පමණි.
- ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත්කරනු ලබන අතර අගමැතිවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයා විසින් සෙසු ඇමැතිවරු පත්කරනු ලබයි.
- අගමැතිවරයා සාමාන්‍යයෙන් රටේ අභ්‍යන්තර කටයුතු සම්බන්ධයෙන් වගකීම් දරනු ලබන අතර ජනාධිපතිවරයා විදේශ කටයුතු, ජාතික ආරක්ෂාව යනාදි ක්ෂේත්‍රවල වගකීම් දරයි.
- අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරයාට සහ පාර්ලිමේන්තුව යන දෙකටම වගකියන අතර එමගින් මේ පාලන ක්‍රමයේ දෙමුහුන් ස්වභාවය පෙන්නුම් කරයි.
- ජනාධිපතිවරයා ධූරය දැරීමේ වාර ගනනෙහි නිශ්චිත ව්‍යවස්ථාමය සීමාවක් පවතී.
- ජනාධිපතිවරයාට කැබිනට් මණ්ඩලය බලයෙන් පහකල හැකි අතර ඇතැම් තත්වයන් තුල පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි ය. එයින් ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ බලපෑම තහවුරු කරයි.

**11 කොටස**

**4. කෝල්බෲක් -කැමරන් ප්‍රතිසංස්කරණවලට අදාළව පහත සඳහන් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.**

**(i) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම**

**(ii) ස්වාධීන අධිකරණයකට පදනම දැමීම**

**(iii) පරිපාලන ක්‍රමය මධ්‍යගත කිරීම** **(ලකුණු 10 x 2 = 20)**

### (i) ආණ්ඩුකාරවරයාගේ බලතල අඩු කිරීම

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට පෙර ආණ්ඩුකරුට පාලන කටයුතු සම්බන්ධයෙන් පරම බලයක් තිබුණි. ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ත්‍රිවිධ බලතල ක්‍රියාත්මක කලේ ආණ්ඩුකරු ය. ආණ්ඩුවට ෂතුරු වූ හෝ රටේ සාමයට තර්ජනයක් වශයෙන් ක්‍රියාකල ඕනෑම පුද්ගලයෙකු නඩු විභාගයකින් හෝ හේතු දැක්වීමකින් තොරව රටින් පිටුවහල් කිරිමට හෝ දින නියමයකින් තොරව සිරභාරයේ තැබීමට ආණ්ඩුකරුට බලය තිබුණි.

සෑම සිවිල් අධිකරණ කටයුත්තකදී ම ඔහු එහි ප්‍රධානියා විය. උඩරට ප්‍රදේශයේ අපරාධ අධිකරණ කටයුතු සම්බන්ධයෙන් පරම බලධාරියා වූයේ ද ඔහු ය. රටවැසියන්ගේ වැටුප් වෙනස් කිරීමට මෙන් ම ඔවුන්ගේ ධනෝපායන මාර්ග වෙනස් කිරීමට ද ඔහුට බලය තිබුණි.

කෝල්බෲක් සහ කැමරන්ගේ නිර්දේශ මත නඩු නොවිමසා කෙනෙකු සිරබාරයට ලැනීමට හෝ රටින් පිටුවහල් කිරීමට ආණ්ඩුකරුට පැවැති බලය කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් අහෝසි කරන ලදි. එතෙක් නීතියට ඉහළින සිටි ආණ්ඩුකාරවරයා නීතියට යටත් කෙරිණි. ශ්‍රේෂ්ඨාධිකරණයේ අධීක්ෂණය යටතේ පොදු අධිකරණ ක්‍රමයක් පිහිටුවීම සමග ඔහුගේ අධිකරණ බලය අවසන් විය.

විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම මගින් ඔහුගේ බලතල තවදුරටත් අඩු කෙරිණි. ආණ්ඩුකරු රටේ සියලු පරිපාලන සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් විධායක සභාවෙන් විමීම අවශ්‍ය විය. විධායක සභාවේ තීරණ වලට ඉහළින් යාමේ බලයක් ආණ්ඩුකරුට පැවැතියත් ඒ තීරණ මුළුමනින් ම නොතකා ක්‍රියා කිරීම පහසු නොවීය.

ආණ්ඩුකරුගේ බලතල අඩු කිරීමට හේතු වූ තවත් ආයතනයක් මෙම ප්‍රතිසංස්කරණ මගින් පිහිටුවන ල ව්‍යවස්ථාදායක සභාවයි. එයට සාමාන්‍ය ව්‍යවස්ථා සම්පාදන කටයුතු හිමි විය. ඒ යටතේ ආණ්ඩුකරු විසින් සම්පාදනය කිරීමට නියමිත රෙගුලාසි පරීක්ෂා කිරීමේ අවස්ථාවක් ව්‍යවස්ථාදායක සභාවට ලබා දුනි. මෙතැන් සිට ව්‍යවස්ථාදායක සභාවට සය එහි නිලනොලත් පිරිසට ආණ්ඩුකරුගේ පාලනය සම්බන්ධයෙන් විවේචනය කිරීමට හැකියාව ලැබුණි. එය එක්තරා ප්‍රමාණයකට ආණ්ඩුකරුගේ බලතල වලට සංවරණයක් විය. රාජකාරි ක්‍රමය සහ ඒකාධිකාරය අහෝසි කිරීම

6. 1947/ 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ බලතල සහ කාර්යයන් 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාවේ බලතල හා කාර්යයන් සමග සසඳන්න

(ලකුණු 20)

1947 ඊ1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1972 ප්‍රතම ජනරජ ව්‍යවස්ථාව මගින් එකනෙකට වෙනස් ව්‍යවස්ථාදායක සභා දෙකක් පිහිටුවනු ලැබිණි. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ මහජන මන්ත්‍රී මණ්ඩලය එම පාර්ලිමේන්තුවේ ප්‍රථම මණ්ඩලය විය. මීට වෙනස්ව, 1972 ව්‍යවස්ථාව මගින් ජාතික රාජ්‍ය සභාව නමින් හඳුන්වන ලද ඒක මණ්ඩල ව්‍යවස්ථාදයකයක් පිහිටුවීය. මේ ව්‍යවස්ථා සභා දෙකෙහි බලතල සහ කාර්යයන් කැපී පෙනෙන ලෙස්'න් වෙනස් විය.

රටේ නීතිය, සාමය සහ මනා පාලනය උදෙසා නීති සම්පාදනය කිරීමේ බලය 1947/1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ මහජන මන්ත්‍රී මණ්ඩලය වෙත පැවරිණි. කෙසේ වෙතත් මහජන මන්ත්‍රී මණ්ඩලය එයට හිමිව පැවැති ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කල යුතු වූයේ ව්‍යවස්ථා සීමාවන්ට යටත්ව ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 (4) වන වගන්තියට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඕනෑම විධිවිධානයක් වෙනස් කිරීමට හෝ අවලංගු කිරීමට පාර්ලිමේන්තුවට බලය තිබුණි. එසේ වුවද, එවැනි සංශෝධනයක සඳහා පාර්ලිමේන්තුවේ සියළු සාමාජිකයන්ගෙන් අඩුම වශයෙන් 2/3 ක ඡන්දයෙන් එය සම්මත විය යුතු විය. එවැනි පනත් කෙටුම්පතක් රාජකීය අනුමැතිය සඳහා ඉදිරිපත් කරන විට එම පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ අවශ්‍ය බහුතරය ලබා ගෙන ඇති බවට සහතිකයක් කතානායකවරයා විසින් ඉදිරිපත් කල යුතු බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ය. පනත් කෙටුම්පතක් සම්මත කිරීමේ දී එම ක්‍රියාපටිපාටිය අනුගමනය නොකලේ නම් අධිකරණය විසින් එම නීතිය අවලංගු කරනු ලබයි.

ඉහත සඳහන් කරුණට අමතරව පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලයට තවත් සීමාවක් තිබුණි. මෙම සීමාකම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 (2) වන වගන්තියෙහි සඳහන් ය. මේ විධිවිධානය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතළත් කරන ලද්දේ වෙනස් ලෙස සැළකීම් වලට ලක්විය හැකි සුළු ජාතීන් හට සහ ආගමික සංවිධාන වලට ඊකවරණයක් ලෙස ිනි. මෙම වගන්තිය උල්ලංඝණය කෙරෙන ලෙස සම්පාදනය කල ඕනෑම නීතියක් අධිකරණයට අවලංගු කිරීමේ බලය තිබුණි. සෝල්බරි ව්‍යවස්ථවෙන් මෙන් නොව 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව කිසිඳු සීමාවකට ලක් නොවුනු ව්‍යවස්ථාදායක බලයක් හිමි කර ගෙන තිබුණි. ජාතික රාජ්‍ය සභාව රාජ්‍ය බලයේ උත්තරතර උපකරණය විය.

1947/ 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ බලයට පැවැති තවත් සීසාවක් වූයේ අධිකරණ විවරණ බලයයි. පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් අවලංගු වන බව ප්‍රකාශ කිරිමේ බලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලිව ප්‍රකාශිතව පවරා තිබුනේ නැත. කෙසේ වෙතත් මෙම බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන වගන්තියේ ව්‍යංගයෙන් ගැබ්ව තිබුණි. අධිකරණය මෙම ඇඟවුම හඳුනා ගනිමින් භාවිතයේ දී අධිකරණ විවරණ බලය ක්‍රියාවෙහි යෙද වීය. 1972 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථා විවරණ බලය අධිකරණයෙන් ඉවත් කළේ ය. ජාතික රාජ්‍ය සභාව විසින් සම්මත කරන ලද පනතක් ප්‍රශ්න කිරීමට අධිකරණයට බලයක් නොවී ය. මහජන මන්ත්‍රී මණ්ඩලය මෙන් නොව ජාතික රාජ්‍ය සභාව කිසිඳු බාහිර අධිකාරියකට යටත් වූ ආයතනයක් නොවී ය.

මහජන මන්ත්‍රී මණ්ඩලය සහ ජාතික රාජ්‍ය සභාව යන ව්‍යවස්ථාදායකයන් දෙකම රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධ පූර්ණ බලයක් භුක්ති වින්දේ ය. බදු ආදායම් සහ රාජ්‍ය වියදම් සම්බන්ධ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කරමින් මහජන මන්ත්‍රී මණ්ඩලයට මුදල් පනත් හඳුන්වා දීමේ බලය ලබා දී තිබුණි. මීට සමාන ලෙස්'න් ජාතික රාජ්‍ය සභාව විසින් රාජ්‍ය මුදල් පාලනය සම්බන්ධයෙන් පූර්ණ බලයක් භුක්ත විඳින ලදි.

මෙම ව්‍යවස්ථා සභා දෙක විසින් ක්‍රියාවට නංවන ලද බලතලවලට අමතරව ප්‍රජාතන්ත්‍රවාදී රටවල ව්‍යවස්ථාදායකයන් විසින් පොදුවේ ක්‍රියාවට නංවනු ලබන කාර්යයන් කිහිපයක් ද ඉටු කලේ ය. මේවාට නීති සම්පාදනය, විධායක කටයුතු අධීක්ෂණය සහ ජනතා නියෝජනය ඇතුලත් විය. එබැවින් ශක්තිමත් පිළිතුරක දී අපේක්ෂකවන් විසින් අදාල ව්‍යවස්ථාදායකයන් විසින් මෙම කාර්යයන් ඉටු කල ආකාරය සාකච්ඡා කරනු ඇත.



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

7. (1) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ ඕනෑම ප්‍රධාන අධිකරණ බල ක්ෂේත්‍ර පහක් දක්වන්න. (ලකුණු 05)

(ii) "ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රමාණවත් ලෙස ින් සහතික කරයි." විවේචනාත්මකව අගයන්න. (ලකුණු 15)

**(i) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 555 ශ්‍රේෂ්ඨාධිකරණයේ ඕනෑම ප්‍රධාන අධිකරණ බල ක්ෂේත්‍ර පහක් දක්වන්න.**

වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඇතැම් වැදගත් අධිකරණ බලතල කිහිපයක් ක්‍රියාවට නංවනු ලබයි. අධිකරණ බලයේ ප්‍රධාන ක්ෂේත්‍ර පහත දක්වේ.

1. පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලභාවය පරීක්ෂා කිරීමේ බලය
2. මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය
3. අවසාන අභියාචනාකරණ බලය
4. උපදේශක අධිකරණ බලය
5. ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් අධිකරණ බලය
6. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීමක් සම්බන්ධයෙන් අධිකරණ බලය සහ
7. පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධයෙන් වූ අධිකරණ බලය

**(ii) "ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අධිකරණයේ ස්වාධීනත්වය ප්‍රමාණවත් ලෙස ින් සහතික කරයි." විවේචනාත්මකව අගයන්න.**

ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාශිතව ම අධිකරණයේ ස්වාධීනත්වය පිළිගෙන තිබේ. අධිකරණයේ ස්වාධීනත්වය අරබයා ඇතැම් නිශ්චිත විධිධාන ව්‍යවස්ථාවට ඇතුලත් කර තිබේ. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයෙකුගේ විශ්‍රාම ගත වයස අවුරුදු 65 ක් වන අතර අභියානාධිකරණයේ විනිශ්චයකරුවකුගේ විශ්‍රාම වයස අවුරුදු 63 ක් වනු ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියානාධිකරණයේ විනිශ්චයකරුවන් ව්‍යවස්ථාවේ සඳහන් වන විශ්‍රාම වයස තෙක් සිය ධූර දරන අතර විනිශ්චයකාරවරයෙකු ධූරයෙන් ඉවත් කල හැක්කේ ඔප්පු වී විෂම පැවැත්ම හෝ අබලතාවය හේතු කොට ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද යෝජනාවක් මගිනි. මීට සමාන ලෙස ින් මහාධිකරණයේ සහ පහල අධිකරණවල විනිසුරුවන් අත්තනෝමතිකව ධූරයෙන් පහ කිරීමට එරෙහිව ආරක්ෂණ විධිවිධාන සපයා ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියානාධිකරණයේ විනිසුරුවන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර එම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වේ. විනිසුරුවන්ගේ වැටුප් සහ විශ්‍රාම වැටුප් සුරක්ෂිත වන අතර ඒවා අඩුකල නොහැකි ය.

ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ කිසිදු විනිශ්චයකාරවරයෙකු වෙනත් කිසිදු තනතුරක කටයුතු කිරීම නැතහොත් ලාභ හෝ වෙනත් වේතනයක් ලබන්නා වූ යම් තනතුරක් පිළිගැනීම ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියානාධිකරණයේ කිසිදු විනිශ්චයකාරවරයෙකු විසින් නොකල යුතුය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 වන වගන්තිය යටතේ පිහිටුවා ඇති අධිකරණ සේවා කොමිසන් සභාව අධිකරණයේ ස්වාධීනත්වය අරභයා වැදගත් භූමිකාවක් ඉටු කරයි. පහළ අධිකරණවල විනිශ්චයකාරවරුන් පත් කිරීම, මාරු කිරීම සහ විනය පාලනය සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිසමට ලබා දී ඇති බලය මගින් දේශපාලන විධායකයෙන් අධිකරණය ස්වාධීනව පවත්වා ගැනීමට පියවර ගෙන තිබේ.

අධිකරණයේ ස්වාධීනත්වය අරබයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මේ ආකාරයෙන් ප්‍රමාණවත් විධිවිධාන සපයා ඇත. මේ ආරක්ෂණ තිබියදීත් දේශපාලන විධායකය අධිකරණයේ ස්වාධීනත්වයට ප්‍රධාන අභියෝගයක් ව පවතී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරන ලද 20 වන සංශෝධනයෙන් අධිකරණ පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ලබා දී ඇති බලය අධිකරණයේ ස්වාධීනත්වයට විශාල හානියක් විය. 21 වන ව්‍යවස්ථා සංශෝධනයෙන් ව්‍යවස්ථා සභාව නැවත හඳුන්වා දෙනු ලැබුව ද විනිශ්චයකරුවන් පත් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට තවදුරටත් බලපෑම් කල හැකි ය. විනිශ්චයකරුවන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය තවත් කරුණකි. විෂම පැවැත්ම හෝ අබලතාව මත පාර්ලිමේන්තුවට විනිසුරුවන් ඉවත්කල හැකි ය. විනිසුරුවන්ට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමේ දී සාධාරණ ක්‍රියාපටිපාටියක් අනුගමනය කල යුතු ය. කෙසේ වෙතත් 2013 වසරේ දී අගවිනිසුරු ශිරානි බණ්ඩාරනායකට ගෙන ආ දෝෂාභියෝගය මගින් පැහැදිලිව පෙන්නුම් කලේ බලයේ සිටින ආණ්ඩුවට පාර්ලිමේන්තුව තුල ඇති ආධිපත්‍යය අධිකරණයට බලපෑම් කිරීම සඳහා යොදාගත හැකි ආකාරයයි. එවැනි පූර්වාදර්ශ මහජන විශ්වාසය දුර්වල කරන අතර ආයතනික අවදානමක් පෙන්නුම් කරයි. ඇතැම් අවස්ථාවල ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් නඩු වලදී සහ ඇතැම් ව්‍යවස්ථාමය කාරණා වලදී ඒවාට ශක්තිමත් ව මුහුණ දීමේ හැකියාව පෙන්නුම් කර තිබේ. 2018 වසරේ ව්‍යවස්ථාමය අර්බුදය තුල විධායක බලය සීමා



Scanned with CamScanner

කරන ආකාරයේ තීන්දු ගෙන තිබුණි. එනමුත් එවැනි ව්‍යුහාත්මක ගැටළු සම්පූර්ණයෙන් ම ඉවත් නොකරයි. එබැවින් අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා තවදුරටත් ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ අවශ්‍ය ය.

## III කොටස

8 . පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න.

**(i) අමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ**

**(ii) එක්සත් රාජධානියේ ඒකීය ආණ්ඩුක්‍රමයේ වෙනස් වන ස්වභාවය**

**(iii) ස්විස් කැන්ටන්වල ස්වයං පාලන බලතල** (ලකුණු 10 x 2 = 20)

**(i) ඇමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ**

- ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලෝකයේ පැරණිතම ලිඛිත ව්‍යවස්ථාවක් වන එය සාපේක්ෂ ලෙස ින් කෙටි ව්‍යවස්ථාවකි. එය පෝෂණය වී ඇත්තේ කොන්ග්‍රස් මණ්ඩලය විසින් සම්මත කළ පනත්, සම්ප්‍රදායන් සහ අධිකරණ තීන්දු මගිනි.
- අමෙරිකානු ව්‍යවස්ථාව පහසුවෙන් වෙනස් කල නොහැකි අනම්‍ය ව්‍යවස්ථාවකි. ව්‍යවස්ථාවට සිදු කරනු ඕනෑම සංශෝධනයක් සඳහා කොන්ග්‍රසයේ මණ්ඩල දෙකෙහි තුනෙන් දෙකක බහුතර සහායට අමතරව ප්‍රාන්ත ආණ්ඩුවල 2/3 ක අනුමැතිය අවශ්‍ය කරයි.
- ව්‍යවස්ථාව සංඝීය ව්‍යවස්ථාවකි.
- ඇමෙරිකානු එක්සත් ජනපදය තුල මෙම ව්‍යවස්ථාව උත්තරීතර ය. මෙය සංඝීය ආණ්ඩුක්‍රමයකට අත්‍යවශ්‍ය අංගයකි.
- මෙම ව්‍යවස්ථාව සංවරණ සහ තුලන ක්‍රමය මත පදනම් වූ බලතල බෙදීමේ න්‍යාය පිළිගත් අතර එමගින් අපේක්ෂා කලේ හිතුවක්කාරී පාලනයක් ඇති වීම වැළැක්වීම ය.
- ඇමෙරිකාවේ පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම්, දේපල සහ නිදහස ආරක්ෂා කිරීම අරබයා අයිතිවාසිකම් පනතක් ව්‍යවස්ථාවට ඇතුළු කර තිබේ.
- අධිකරණය සතු නීති විවරණ බලය එම ආණ්ඩුක්‍රමයේ ඇති තවත් වැදගත් ලක්ෂණයකි. මෙම බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථවෙන් ප්‍රකාශිතව සඳහන් නොකලත් මාබරි එ. මැඩිසන් නඩුවෙන් අධිකරණය ලබා ගත්තේ ය. ඉන් පසුව මෙය ව්‍යවස්ථාවට අනියමින් ඇතුළු විය.
- ඇමෙරිකානු එක්සත් ජනපදය සමූහාණ්ඩුවකි. ඇමෙරිකානු ව්‍යවස්ථාව එය සතු බලය ජනතාවගෙන් ලබා ගත්තකි.

පහත සඳහන් කරුණු ද අපේක්ෂකයන් විසින් සාකච්ඡාවල ලක් කල හැකි ය. එනම් අනාගමික රාජ්‍යයක් බව, ලෝකයේ බලවත් දෙවන මණ්ඩලයක් පවතින බව සහ සංවරණ සහ තුලන ක්‍රමය මත පදනම් පාලන ක්‍රමයක් පවතින බව දැක්විය හැකි ය.

**(ii) එක්සත් රාජධානියේ ඒකීය ආණ්ඩුක්‍රමයේ වෙනස්වන ස්වභාවය**

මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ බ්‍රිතාන්‍ය ඒකීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුල ඇති වූ මෑත කාලීන වෙනස්කම් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම තක්සේරු කිරීමයි.
බ්‍රිතාන්‍ය ව්‍යවස්ථා ක්‍රමය සියවස් ගණනාවක් තිස්සේ සිට පැවතියේ ඒකීය ව්‍යවස්ථාවකට ප්‍රධාන ආකෘතියක් ලෙස ිනි. එම ව්‍යවස්ථාවේ මෑත කාලීන ප්‍රවනතාවක් වන්නේ එය සම්ප්‍රදායික ඒකීය ආකෘතියෙන් බැහැර වීමයි. 1998 වසරේ දී ස්කොට්ලන්තයට, වේල්සයට, සහ උතුරු අයර්ලන්තයට බලය බෙදා හැරීම සිදුකර ඇත්තේ පහත සඳහන් පාර්ලිමේන්තු පනත් මගිනි.

1. 1998 ස්කොට්ලන්ත පනත
2. 1998 වේල්ස් ආණ්ඩු පනත සහ
3. 1998 උතුරු අයර්ලන්ත පනත

ප්‍රාදේශික ජාතිකවාදයේ නැගීම බ්‍රිතාන්‍ය ඒකීය ආකෘතිය වෙනස් වීමට බලපෑ ප්‍රධාන හේතුව ලෙස සැළකිය හැකි ය. ස්කොට්ලන්ත, උතුරු අයර්ලන්ත, සහ වේල්සය වෙත බලය බෙදා හැරීම එනම් පලාත් තුනට ලබා දී ඇති ස්වයං පාලනයේ ප්‍රමාණය එක සමාන නොවේ. මෙය අසමමිතික බලය බෙදා හැරීමේ ක්‍රමයකි. මේ යටතේ වේල්සයට සහ උතුරු අයර්ලන්තයට වඩා වැඩි බලය බෙදා හැරීමක් ස්කොට්ලන්තයට සිදුකර ඇත.



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

එක්සත් රාජධානියේ බලය බෙදා හැරීමේ ක්‍රමය තුල, වෙස්මින්ස්ටර් පාර්ලිමේන්තුව ආරක්ෂාව, ආගමන විගමන, විදේශ ප්‍රතිපත්තිය, රැකියා, ගුවන් විදුලිය, වෙළඳාම සහ කර්මාන්ත, න්‍යෂ්ටික බලශක්තිය සහ විදුලිය, පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනාදි විෂයන් රඳවා ගෙන ඇත. මධ්‍යම ආණ්ඩුව සතු මේ බලතල නම් කර ඇත්තේ reserved powers යනුවෙනි. පළාත් වලට බෙදා හැර ඇති බලතල නම්කර තිබෙන්නේ transferred යනුවෙනි.
වර්තමානයේ බ්‍රිතාන්‍ය ව්‍යවස්තාව තවදුරටත් මුළුමනින් ම ඒකීය ව්‍යවස්ථාවක් නොවේ. එමෙන්ම එය සංධීය ව්‍යවස්ථාවක් ද නොවේ. එය පුළුල් ලෙස ඒකීය රාජ්‍යයක් තුල බලය බෙදා හැරීමට ඉඩ සළසන ලද ක්‍රමයකි. එබැවින් බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාව හැඳින්විය හැක්කේ දෙමුහුන් ව්‍යවස්ථාවක් ලෙස ්නි. මෙය සම්ප්‍රදායික ඒකීය ආකෘතියෙන් ප්‍රධාන ලෙස වෙන්ව යාමකි.

### (iii) ස්විස් කැන්ටන්වල ස්වයං පාලන බලතල

පහත සඳහන් ස්වයං පාලන බලතල ස්විස් කැන්ටන් වලට තිබේ.

- කැන්ටන් වලට ඔවුන්ගේම ව්‍යවස්ථා කෙටුම්පත් කල හැකි ය. ඒ අනුව ඔවුන්ගේම දේශපාලන ක්‍රමයක්, ජාතික ගීයක් සහ ජාතික කොඩියක් තීරණය කළ හැකි ය.
- කැන්ටන් වලට ඔවුන්ගේම ඔවුන්ගේ ම පළාත් ආණ්ඩු ඒකක වල බලතල තීරණය කළ හැකි ය. කෙසේ වෙතත් එම බලතල මගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කල නොහැකි ය.
- පෙඩරල් අධිකරණය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කරයි.
- අධ්‍යාපනය සම්ප්‍රදායික ලෙස ්න් ම කැන්ටන්වල වගකීමකි. විෂය මාලා සකස් කිරීම, පත් කිරීම් සහ අධ්‍යයන කාර්ය මණ්ඩල පිළිබඳ බලය කැන්ටන් වලට අයත් ය.
- සාමකාමී කාලවල නීතිය හා සාමය පවත්වා ගෙන යාම කැන්ටන්වල වගකීමකි.
- ඇතැම් ව්‍යතිරේකයන්ට යටත්ව සංස්කෘතික කටයුතු වලට සහාය දැක්වීමත් සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීමත් කැන්ටන් වලට අයත් බලයකි.
- මාර්ග ඉදි කිරීම, විදුලිය සහ ජලය සැපයීම කැන්ටන්වල වගකීමකි.
- කැන්ටන් වලට බදු අය කිරීමට බලය තිබේ.
  මීට අතිරේකව, කැන්ටන් වලට ඒවායෙහි නිළ භාෂාව කුමක් ද යන්න තීරණය කිරීමේ බලය තිබේ.

**9. ලෝකයෙහි නව දේශපාලන හා ආර්ථික ප්‍රවනතා ශ්‍රී ලංකාවට ඇතිකරන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 20)**

වර්තමාන අන්තර් සම්බන්ධිත ලෝකයේ කිසිඳු රටක හුදකලාව ක්‍රියාකල නොහැකි ය. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ද එය එසේ ම ය. ගෝලීය යථාර්තයන් හමුවේ ශ්‍රී ලංකාවේ දේශීය ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙලවල් අඛණ්ඩව බාහිර දේශපාලන හා ආර්ථක බලවේග වල බලපෑමට ලක්වේ. මෙය හඳුනා ගැනීමට නම් සමකාලීන ප්‍රධාන ලෝක ප්‍රවනතා හඳුනා ගැනීම සහ ඒවා ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදනය බලපාන ආකාරය පරීක්ෂා කිරීම අවශ්‍ය වේ.
ශ්‍රී ලංකාවට බලපාන ප්‍රධාන ගෝලීය නැම්යාවන් අතුරින් කිහිපයක් නම්

- ගෝලීයකරණය
- බලතුලනයන් මාරුවීම
- ඉන්ද්‍ර-පැසිෆික් එදිරිවාදිකම්
- යටිතල පහසුකම් මූල්‍යකරණය
- භාණ්ඩ මිල උච්ඡාවචනයන්
- තාක්ෂණික විපර්යාස සහ ආපදා අවදානම

මේ සෑම ගතිකයක්ම තනි තනිව හා එක්ව ශ්‍රී ලංකාවේ දේශීය ප්‍රතිපත්ති කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් කරයි.

- **ගෝලීයකරණය**

ගෝලීයකරණය යනු රාජ්‍යයන්ගේ දේශපාලන සහ ආර්ථික ස්වාධිපත්‍ය හැඩ ගස්වන බහුවිධ ක්‍රියාවලියකි. ගෝලීකරණ සන්දර්භය තුල රටක ස්වෛරීභාවය කෙරෙහි ඇති කරන බලපෑම් වලින් ජාත්‍යන්තර මානව හිමිකම් තන්ත්‍රය තහවුරු කිරීම ය. පාලන විලාසය සහ දෘෂ්ටිවාදය හේතුවෙන් කලක් මෙම තන්ත්‍රයට අඩුවෙන් සම්බන්ධව සිටි ශ්‍රී ලංකාව වර්තමානය වන විට මානව හිමිකම්වල



Scanned with CamScanner

වැදගත්කම පිළිබඳවත් එයට ඇති ජාත්‍යන්තර පිළිගැනීමත් හඳුනා ගෙන තිබේ. එමෙන් ම මානව හිමිකම් සුරකීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම සංවර්ධන ආධාර කෙරෙහි බලපාන බව මේ වන විට ශ්‍රී ලංකාව හඳුනා ගෙන තිබේ.

ආර්ථික වශයෙන් ගත්විට ගෝලීය ආර්ථිකයට සම්බන්ධ වීම ශ්‍රී ලංකාව වැනි කුඩා රාජ්‍යයන්ගේ ස්වෛරීත්වය සීමා කරයි. ඒ අනුව සම්ප්‍රදායික අර්ථයෙන්ම ආර්ථික ස්වාධිපත්‍යය පවත්වා ගෙන යාමට ඇති ධාරිතාවට සීමාකම් පැන වේ. උදාහරණයක් ලෙස 1980 මැද භාගයේ සිට ශ්‍රී ලංකාවේ ආර්ථික ලිබරල්කරණය සැබැවින්ම ස්වේච්ඡා ප්‍රතිපත්ති වලට මාරුවීමකට වඩා ගෝලීය ආර්ථික බලවේග වල බලපෑමට ලක් වීමේ ප්‍රතිඵලයක් විය. උදාහරණ වශයෙන් 2008 වසරේ ලෝක මූල්‍ය අර්බුදයේ බලපෑමට ශ්‍රී ලංකාව ද ලක් වූ අතර එමගින් වෙළඳ පරිමාව, මූල්‍ය ප්‍රවාහය සහ විශ්වාසය අඩු වූ අතර එම නිසා ශ්‍රී ලංකා ආණ්ඩුවට තම මූල්‍ය ප්‍රතිපත්ති නැවත සළකා බැලීමට සිදු විය. 2022 වසරේ දී ශ්‍රී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය හමුවේ මෙම යැපීම තවදුරටත් පෙන්නුම් කෙරිණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ ණය ප්‍රතිව්‍යුහගත කිරමට ගත් උත්සාහය තුල බදුකරණය, දූෂණ විරෝධී පියවර සහ මූල්‍ය නියාමනයේ ප්‍රතිපත්ති අවශ්‍ය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීයකරණය හමුවේ ශ්‍රී ලංකාවට ආර්ථික ස්ථාවරත්වය සහ නැවත යථා තත්වයට පත් වීම සඳහා බාහිර මැදිහත්වීම් මත තවදුරටත් වැඩිවැඩියෙන් යැපීමට සිදු විය.

- **බලතුලනයත් මාරු වීම**

චීනයේ නැගීම සහ බටහිර ආධිපත්‍යයේ සාපේක්ෂ පරිහානිය මගින් සළකුණු කරන ලද බහුධ්‍රැවීයතාව කරා ඇති වූ ගෝලීය සංක්‍රාන්තිය ශ්‍රී ලංකාවට සිය විදේශ ප්‍රතිපත්තිය නැවත සකස් කිරීමට බලපෑම් කර තිබේ. සංවර්ධන ආධාර මත යැපෙන රටක් ලෙස ශ්‍රී ලංකාව, ඉන්දියාව, ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය සමග ශක්තිමත් සම්බන්ධතා පවත්වා ගනිමින් චීනය සමග ආර්ථික සම්බන්ධතා දැඩි කිරීමට උත්සාහ ගෙන ඇත. කෙසේ වෙතත් මෙම තුලනය කිරීමේ උත්සාහය දේශීය දේශපාලන සංවේදිතාවන් ජනනය කරයි. විශේෂයෙන් විදේශීය බලවතුන් විසින් අරමුදල් සපයන යටිතල පහසුකම් ව්‍යාපෘති බොහෝවිට මතභේදාත්මක වේ. එයට ප්‍රධාන හේතුවක් වන්නේ ඒවායෙහි පවතින උපාය මාර්ගික ඇඟවුම් නිසයි.

- **ඉන්දු - පැසිෆික් එදිරිවාදිකම්**

ඉන්දු පැසිෆික් කලාපයේ වර්ධනය වන උපාය මාර්ගික තරගකාරිත්වය යටිතල පහසුකම් සහ ණය සුරක්ෂිත කර තිබේ. ඉන්දියානු සාගරයේ තීරණාත්මක ස්ථානයක පිහිටා ඇති ශ්‍රී ලංකාවට මෙම එදිරිවාදිකම් එහි විදේශ ප්‍රතිපත්ති තේරීම් සංකීර්ණ කිරීමට හේතු වේ. මේ අනුව ශ්‍රී ලංකාව ආර්ථික ප්‍රතිලාභ උපරිම කරන අතරම ප්‍රධාන බලවතුන් සමග සම්බන්ධතා සමතුලිත කිරීමට උත්සාහ කරයි. දේශීය වශයෙන් මෙය යටිතල පහසුකම් සහ ආයෝජන තීරණ ඉහළ පරීක්ෂාවකට ලක් වේ. මෙම උපාය මාර්ගික තුලනය විශේෂයෙන් පැහැදිලි වූයේ 2022 වසරේ අර්බුදයෙන් පසුව ය. එනම් රනිල් වික්‍රමසිංහ යටතේ පැවැති අන්තර් කාලීන ආණ්ඩුව සියළු ප්‍රධාන හවුල්කරුවන් සමග විශ්වාසය නැවත ගොඩ නැගීමට උත්සාහ කල විට ය. වර්තමාන ආණ්ඩුව ද මෙම ප්‍රවේශයට අනුගත ව ඇති බවක් පෙනෙන්නට තිබේ.

වඩා හොඳ පිළිතුරක දී මෙම ගෝලීය නැම්යාවන් ට අමතරව ඉහතින් නම් කරන ලද සෙසු නැම්යාවන් ද සාකච්ඡා කරනු ඇත.

**නිගමනය**

අභ්‍යන්තර ප්‍රතිපත්තිය ගෝලීය දේශපාලන හා ආර්ථික ප්‍රවනතා සමග ගැඹුරින් බැඳී පවතී කුඩා ගෝලීය වශයෙන් ඒකාබද්ධ වූ සහ ආනයන මත යැපෙන රාජ්‍යයක් ලෙස එය මූල්‍ය, වෙළඳමෙ සහ ආරක්ෂක පරිසරයන්හි උච්චාවචනයන්ට ගොදුරු විය හැකි ය IMF විසින් මෙහෙයනවන ලද කොන්දේසි සහ වෙළඳාම සම්බන්ධිත පාලන ප්‍රමිතීන්ගේ සිට උපාය මාර්ගික තරගකාරිත්වය සහ දේශගුණික අවදානම දක්වා බාහිර බලපෑම් එහි දේශීය න්‍යාය පත්‍රය අඛණ්ඩව හැඩ ගස්වයි.



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

10 පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

(i) ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය

(ii) සාමය ගොඩනැගීමේ සංකල්පය

(iii) ලෝක සාමය සහතික කිරීමේ දී එක්සත් ජාතීන්ගේ කාර්යභාරය

(iv) නිරාගමිකවාදය

(v) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධූරයෙහි පවතින ප්‍රජාතන්ත්‍ර විරෝධි ලක්ෂණ (ලකුණු 10 x 2 = 20)

(i) ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී දේශපාලන පක්ෂවල කාර්යභාරය

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය යනු ජනතාවගේ අවශ්‍යතා, අභිලාෂ, ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වන ගතික ක්‍රියාවලියකි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම තුල දේශපාලන පක්ෂ, ජනතාව සහ ආණ්ඩුව අතර වැදගත් සම්බන්ධතාවයක් ඇති කරයි. මේ අර්ථයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට දේශපාලන පක්ෂ විසින් පහසුකම් සපයයි. අවසානයේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලබන්නේ ආණ්ඩුව සහ රාජ්‍ය නිළධාරිතන්ත්‍රය විසින් වුවද, ඒවා පුරවැසියන්ගේ අවශ්‍යතා සහ අභිලාෂ පිළිබිඹු කරයි.

1. දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති සහ න්‍යායපත්‍ර තුලින් ප්‍රතිපත්ති සම්පාදනයේ සෑම පියවරක් තුල වැදගත් භූමිකාවක් ඉටු කරයි.

2. දේශපාලන පක්ෂ න්‍යාය පත්‍ර තුලින් රාජ්‍ය ප්‍රතිපත්ති වලට ඇතුලත් කරගත යුතුව තිබෙන ගැටළු පිළිබඳව මහජන සාකච්ඡා සහ ප්‍රවාද ගොඩ නගයි. දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති ගැටළු සම්බන්ධයෙන් මහජන සහාය ලබා ගැනීමට ක්‍රියා කරයි.

3. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන් තුල දේශපාලන පක්ෂ රාජ්‍ය ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට ඇතුලත් කල යුතු පොදු ගැටළු ලෙස්ින් පොදු ක්ෂේත්‍රය තුල පවතින ගැටළු ක්‍රමාණුකූල ලෙස්ින් සකස් කරයි.

4. දේශපාලන පක්ෂ ජනතාවගේ අවශ්‍යතා සහ අභිලාෂ ප්‍රතිපත්ති සාකච්ඡා සමග ඒකාබද්ධ කරයි.

5. දේශපාලන පක්ෂ පවතින ප්‍රතිපත්ති සහ යෝජිත ප්‍රතිපත්තිවල පවතින යහපත් සහ අයහපත් අංග සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කරයි.

6. ප්‍රතිපත්ති අරභයා මහජන ප්‍රතිචාර යොමු කිරීමටත් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට පුරවැසියන්ගේ සහභාගිත්වය ලබා ගැනීම සහාත් දේශපාලන පක්ෂ විසින් පහසුකම් සළසනු ලබයි. මෙමගින් ජනතාව සහ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර සම්බන්ධතාවයක් ඇති කිරීමට ක්‍රියා කරයි.

මීට අතිරේකව දේශපාලන පක්ෂ ආණ්ඩු බලය දරන විට, ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාවට නැංවීම සහ ඒවා සංශෝධනය කිරීම තු ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි.

(ii) සාමය ගොඩ නැගීමේ සංකල්පය

සාමය ගොඩ නැගීමේ සංකල්පය මතභේදාත්මක සංකල්පයකි. එහි අර්ථය බොහෝ විට වෙනස් වන්නේ (1) එය ක්‍රියාත්මක කරන විට සහ (2) එය කුමන ආකාරයේ සාමයක් ඇති කිරීමට උත්සාහ කරනවාද යන්න සහ (3) කවුරුන් සම්බන්ධ වේද සහ කුමන මට්ටම් වලද යන්න මත ය.

සාමය ගොඩ නැගීම අදියර දෙකකදී සිදුවිය හැකි ය. එනම් (1) පශ්චාත්-සාමය ගොඩ නැගීම සහ (2) පූර්ව ගැටුම් සාමය ගොඉ නැගීම

සාමය ගොඩ නැගීම මේ අදියර දෙකම ආවරණය කල හැකි වුවත් බොහෝ සමකාලීන සාකච්ඡා වලදී මේ පදය බොහෝ විට යොදාගනු ලබන්නේ පශ්චාත් ගැටුම් අවධිය සඳහා ය. සාමය ගොඩ නැගීම එය නිපදවන්නේ කුමන ආකාරයේ සාමයක් ද යන්න මත වෙනස් වේ.

යොහාන් ගල්ටුන් අනුගමනය කරමින් සාමය ගොඩ නැගීම අදහස් දෙකකට සම්බන්ධ කල හැකිය. (1) නිශේධනාත්මක සාමය සහ (2) ධනාත්මක සාමය යනුවෙනි.

බල්පවත්නා සාමය පිළිබ අදහස ගල්ටුන් පසුව එකතු කරයි. සාමය කාලයත් සමග පැවැතිය යුතු අතර එයට නව අභියෝග වලට ප්‍රතිචාර දක්වීමට හැකියාව තිබිය යුතු ය. මේ අනුව සාමය ගොඩ නැගීම අවබෝධ කරගත හැක්කේ යුද්ධය අවසන් කිරීම පමණක් නොව ධනාත්මක සහ චිරස්ථායි සාමය ගොඩ නැගීමේ උත්සාහයකිනි.



Scanned with CamScanner

### (iii) ලෝක සාමය සහතික කිරීමේ දී එක්සත් ජාතීන්ගේ කාර්යභාරය

එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටවන ලද්දේ ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යාම, රාජ්‍යයන් අතර මිත්‍රශීලී සම්බන්ධතාවය වර්ධනය කිසිම සහ සංවර්ධන උත්සාහයන් සම්බන්ධීකරණය සඳහා සංසදයක් ගොඩ නැගීමයි. මේ අරමුණු අතුරින් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන මෙහෙයුම වන්නේ සාමය සහ සුරක්ෂිතභාවයයි.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 1 වන වගන්තියෙහි දක්වෙන්නේ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන අරමුණ ජාත්‍යන්තර සාමය පවත්වා ගැනීම බවයි. මෙම ප්‍රඥප්තියේ ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා ආරක්ෂක කවුන්සිලයට ප්‍රධාන වගකීම පවරයි. ආරක්ෂක කවුන්සිලය සාමාන්‍යයෙන් මුල පුරන්නේ සාමකාමී පියවරයන් ගෙනි. ඒවා නම්,

- සාකච්ඡා සහ සංවාද නිර්දේශ ඉදිරිපත් කිරීම
- ආරවුල් විමර්ශනය සහ කරුණු සොයා බැලීම
- පාර්ශවයන් අතර මැදිහත් වීම
- විශේෂිත නියෝජිතයන් සහ දූතයන් පත් කිරීම
- රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලට සහාය වීම අරබයා මහලේකම්වරයාගේ 'good offices' භාවිතා කිරීම

  මේ පියවරයන් මගින් ප්‍රචණ්ඩත්වය නැවැත්විය නොහැකි නම් ආරක්ෂක කවුන්සිලය පහත සඳහන් පියවර ගනු ඇත.
- සටන් විරාමයක් ඉල්ලා සිටීම
- එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා අවසර දීම
- සම්බාධක පැනවීම
- අවශ්‍ය විටෙක සාමූහික හමුදා ක්‍රියාමාර්ග සඳහා අවසර දීම

  වඩා පලල් ලෙස ින් පශ්චාත් ගැටුම් ප්‍රතිසාධනය සඳහා රාජ්‍ය තාන්ත්‍රිකභාවය, සාම මෙහෙයුම් සහ මෙවලම් සැපයීමෙන් එක්සත් ජාතීන් සාමය සඳහා ගෝලීය රාමුවක් සපයයි.

### (iv) නිරාගමිකවාදය

නිරාගමිකවාදයෙන් අදහස් වන්නේ ආගම සහ දේශපාලනය වෙන් කිරීමයි. මෙය සමාජවාදි ශපාලන මතවාදයෙහි මෙන්ම ලිබරල් දේශපාලන මතවාදයෙහි අංගයකි. ලිබරල් සහ සමාජවාදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ස්වභාවයෙන් ම නිරාගමික වීම අපේක්ෂා කරයි. මේ අනුව නිරාගාමිකවාදය ලිබරල් නිරාගමිකවාදය සහ සමාජවාදි නිරාගමිකවාදය ලෙස ින් බෙදා දැක්විය හැකි ය.

නිරාගමිකවාදය පිළිබඳ අදහස මුලින්ම විකාශය වූයේ 18 වන සහ 19 වන සියවස් වල දී යුරෝපයේ ය. එය යුරෝපයේ ප්‍රබුද්ධ චින්තනයේ කොටසක් ලෙස පරිනාමනය විය. යුරෝපය තුළ නිරාගමිකවාදය වර්ධනය වූයේ රාජ්‍ය සම්බන්ධයෙන් කතෝලික/ක්‍රිස්තියානි පල්ලිය විසින් ක්‍රියාවට නන්වනු ලැබූ පාලනයට විරුද්ධත්වය පල කිරීමේ මතවාදයක් ලෙස ිනි.

සිතීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස සහ පුද්ගල නිදහස පිළිබඳ ලිබරල් මූලධර්ම නිරාගමිකවාදයට සම්බන්ධ විය. ආගම සහ එහි භාවිතයන් පුද්ගලික කාර්යයක් යන ලිබරල් සීමාවන් මත පුද්ගලයන්ට ආගමික නිදහස සහතික කිරීමට ලිබරල්වාදය උත්සාහ කරයි. නිරාගමිකවාදය පිළිබඳ සමාජවාදි අදහස ආගම සමාජ පීඩනයේ මූලාශ්‍රයක් යන අදහසින් උපුටා ගන්නා ලදි. මෙලෙස ආගම/පල්ලිය රාජ්‍යයෙන් / දේශපාලනයෙන් වෙන් කිරීම පිළිබඳ අදහස ලිබරල් සහ සමාජවාදි යන මතවාද දෙකෙහිම ප්‍රධාන සටන් පාඨයක් බවට පත් විය.

නිරාගමිකවාදය පිළිබඳ ඉන්දියාව තුළ අඛණ්ඩ විවාදයක් තිබේ. 1976 දී ඉන්දියානු ව්‍යවස්ථාවට හඳුන්වා දෙන ලද 42 වන සංශෝධනයෙන් ඉන්දියානු සමූහාණ්ඩුව නිරාගමික වියයුතු බව සඳහන් කළේ ය.

### (v) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති ධූරයෙහි බවතින ප්‍රජාතන්ත්‍ර විරෝධී ලක්ෂණ

ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපති ධූරය සම්බන්ධයෙන් තවදුරටත් ඇතැම් ප්‍රජාතන්ත්‍ර විරෝධී ගති ලක්ෂණ පවතී.

- එක් පුද්ගලයෙකු වටා බලතල ඒකරාශී වීම

  රාජ්‍ය නායකයා වීම, ආණ්ඩුවේ නායකයා වීම, විධායකයේ නායකයා වීම, සහ සන්නද්ධ හමුදාවල ප්‍රධානියා වීම



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

- සංකීර්ණ දෝෂාභියෝග ක්‍රියාවලියෙන් මිස ජනාධිපතිවරයා ව පහසුවෙන් ධූරයෙන් ඉවත් කල නොහැකි වීම
- කැබිනට් මණ්ඩල සම්බන්ධයෙන් තවදුරටත් සැළකිය යුතු පාලනයක් පැවැතීම
- පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය
  පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් සීමාකම් පැවැතියත් වසර දෙක හමාරකට පසුව පාර්ලිමේන්තුව ඇති බලය මගින් තවදුරටත් ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව කෙරෙහි බලපෑම් කළ හැකි ය.
- ජනාධිපතිවරායාට ඇති මුක්තිය මුළු මනින්ම ඉවත් නොවීම
- ප්‍රධාන පත් කිරීම් සම්බන්ධයෙන් තවදුරටත් බලපෑම් කල හැකි වීම



Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය: ....................................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 2 | |
| 2 | 3 - 9 | |
| 3 | 10 - 17 | |
| 4 | 18 - 23 | |
| 5 | 24 - 30 | |
| 6 | 31 - 38 | |
| 7 | 39 - 46 | |
| 8 | 47 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**1.** අප දේශපාලන විද්‍යාව ඉගෙන ගන්නේ ඇයි?

(1) දේශපාලන ක්‍රම ක්‍රියාත්මක වන්නේ කෙසේ දැයි තේරුම් ගැනීමට ය.
(2) සමාජ ගැටලුවල ස්වභාවය තේරුම් ගැනීමට ය.
(3) මානව චර්යාව තේරුම් ගැනීමට ය.
(4) රාජ්‍යය සහ ආණ්ඩුවේ ආධ්‍යාත්මික පදනම හඳුනා ගැනීමට ය.
(5) සමාජ සංවිධාන ක්‍රියාකරන ආකාරය තේරුම් ගැනීමට ය. (......)

**2.** පහත සඳහන් විෂයයන්ගෙන් දේශපාලන විද්‍යාවට සමීපව සම්බන්ධ වන්නේ කවර විෂය කාණ්ඩය ද?

(1) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, ඉතිහාසය, භූගෝල විද්‍යාව සහ භෞතික විද්‍යාව
(2) මානව විද්‍යාව, නීතිය, ආර්ථික විද්‍යාව, ඉතිහාසය සහ රසායන විද්‍යාව
(3) ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, භූගෝල විද්‍යාව, නීතිය සහ ඉතිහාසය
(4) දර්ශනය, ආර්ථික විද්‍යාව, මානව විද්‍යාව, සමාජ විද්‍යාව සහ තාරකා විද්‍යාව
(5) නීතිය, ආර්ථික විද්‍යාව, මනෝ විද්‍යාව, ඉතිහාසය සහ භූ විද්‍යාව (......)



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

3. දේශපාලන විද්‍යාවේ තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ
   (1) විවිධ දේශපාලන ක්‍රම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය ඇගයීමට ය.
   (2) දේශපාලනයෙහි සැබැවින් ම පවතින දෙයට වඩා පැවතිය යුතු දේවල් කෙරෙහි ය.
   (3) සමාජයේ මිනිසුන්ගේ දේශපාලන හැසිරීම අධ්‍යයනය කිරීමට ය.
   (4) විවිධ සංස්කෘතීන් තේරුම් ගැනීම කෙරෙහි ය.
   (5) දේශපාලනය සහ ආර්ථිකය අතර අන්තර් සම්බන්ධතාවය කෙරෙහි ය. (......)

4. රාජ්‍යයේ ස්වභාවය වඩාත් හොඳින් පැහැදිලි කරනුයේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?
   (1) නිශ්චිත භෞමික දේශසීමාවන් නොමැති ස්වේච්ඡා සංවිධානයක් ලෙසිනි
   (2) ස්වේච්ඡා සාමාජිකත්වයෙන් සැදුම්ලත් සංවිධානයක් ලෙසිනි
   (3) ආරක්ෂක සහ ආර්ථික ප්‍රතිලාභ සඳහා නිර්මාණය කරන ලද තාවකාලික ආයතනයක් ලෙසිනි
   (4) ස්වාධිපති බලයෙහි එකම හිමිකරුවා ලෙසිනි
   (5) ආණ්ඩුවේ මෙවලමක් ලෙසිනි (......)

5. පහත සඳහන් දේශපාලන මතවාද අතුරෙන් සමාජ සමානාත්මතාවය සහ නිෂ්පාදන මාධ්‍යයන්ගේ පොදු අයිතිය යනාදී මූලධර්ම වෙනුවෙන් පෙනී සිටින මතවාදය කුමක් ද?
   (1) ලිබරල්වාදය
   (2) සමාජවාදය
   (3) ෆැසිස්ට්වාදය
   (4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
   (5) ජාතිකවාදය (......)

6. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයේ කේන්ද්‍රීය ලක්ෂණය නිවැරදිව පිළිබිඹු කරනුයේ පහත සඳහන් ඒවායින් කුමකින් ද?
   (1) ආණ්ඩුව ව්‍යවස්ථාමය සීමාවන්ගෙන් බැඳී සිටී.
   (2) ආණ්ඩුවක් වෙනස් කිරීම සාමාන්‍යයෙන් දුෂ්කර ක්‍රියාවලියකි.
   (3) ආණ්ඩුවේ කැමැත්ත පරිදි පුද්ගල නිදහස ප්‍රදානය කරයි.
   (4) පාලකයෝ නීතියට ඉහළින් සිටිති.
   (5) ආණ්ඩුව සැමවිට ම ප්‍රභූන්ගේ අභිලාෂ වෙනුවෙන් කටයුතු කරයි. (......)

7. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් තුළ
   (1) වෘත්තිමය දේශපාලනඥයින් ලෙස වෙනම පංතියක් නොමැත.
   (2) සියලු දේශපාලන තීරණ ගනු ලබන්නේ ජනතාව විසින් ය.
   (3) ආණ්ඩුව සහ පාලිතයන් අතර වෙනස පැහැදිලි නැත.
   (4) පුරවැසියෝ ආණ්ඩුවේ සියලු කටයුතු කිරීමට බැඳී සිටිති.
   (5) ජනතාව තමන් වෙනුවෙන් තීරණ ගනු ලබන්නන් පාලකයන් ලෙසින් තෝරා පත් කර ගනිති. (......)

8. පහත සඳහන් ඒවායින් සංධීය ආණ්ඩු ක්‍රමයක ලක්ෂණයක් වන්නේ කවරක් ද?
   (1) ස්වාධිපත්‍යය ආණ්ඩු මට්ටම් දෙකක් අතර පංගු කර ගනී.
   (2) මුළු රටෙහි ම ඒකාකාර නෛතික හා පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යනු ලැබෙයි.
   (3) පළාත් පාලන ආයතන සඳහා බලතල ලැබෙනුයේ මධ්‍යම ආණ්ඩුව වෙතිනි.
   (4) මධ්‍යම ආණ්ඩුවේ ව්‍යවස්ථාදායකයට එහි අභිමතය පරිදි ඕනෑම නීතියක් සම්පාදනය කළ හැකි ය.
   (5) සියලු ම නීති සම්පාදනයෙහි ඒකාධිකාරිය පවරා තිබෙන්නේ මධ්‍යම ආණ්ඩුවට ය. (......)

9. බලතල බෙදීමේ න්‍යායට අනුකූල වන ප්‍රකාශය තෝරන්න.
   (1) නූතන රාජ්‍යයන් තුළ පරිපූර්ණ ලෙසින් බලතල බෙදීම කළ හැකි ය.
   (2) අධිකරණය, විධායකයේ සහ ව්‍යවස්ථාදායකයේ පාලනයෙන් නිදහස්ව ක්‍රියාත්මක විය යුතු ය.
   (3) බලතල බෙදීම ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයකට අත්‍යවශ්‍ය අංගයක් නොවේ.
   (4) බලතල බෙදීමේ මූලධර්මය තෝමස් හොබ්ස්ගේ ලේඛන තුළින් සොයා ගත හැකි ය.
   (5) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය තුළ බලතල බෙදීම දැඩි ලෙස ක්‍රියාත්මක වේ. (......)

[දහවැනි පිටුව බලන්න



Scanned with CamScanner

**10.** පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ දී
(1) අගමැති නිලයෙහි වාර ගණන සීමා කරයි.
(2) අගමැති, ආණ්ඩුවේ ප්‍රධානියා මෙන්ම රාජ්‍යයේ ප්‍රධානියා ලෙස ද ක්‍රියා කරයි.
(3) කැබිනට් මණ්ඩලය හා ව්‍යවස්ථාදායකය අතර සබඳතාවය පැහැදිලි ලෙසින් දක්වා නැත.
(4) ආණ්ඩුව ව්‍යවස්ථාදායකයෙන් බිහි වේ.
(5) දේශපාලන විධායකය, ව්‍යවස්ථාදායකයට ව්‍යවස්ථානුකූල ලෙසින් වග නොකියයි. (......)

**11.** පහත සඳහන් සංකල්පවලට දෙන ලද විස්තර අතුරෙන් එකක් පමණක් නිවැරදි ය. නිවැරදි විස්තරය අයත් සංකල්පය තෝරන්න.
(1) පුරවැසියා - රාජ්‍යයේ පූර්ණ සාමාජිකත්වයට අයත් අයිතිවාසිකම් සහ බැඳීම්වලට හිමිකම් ඇති රාජ්‍යයක පූර්ණ සාමාජිකයෙකි.
(2) චර්යාවාදය - සමාජ හා දේශපාලන ආයතනවල ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීමේ ප්‍රවේශයකි.
(3) ස්වාධිපත්‍යය - ස්වේච්ඡා සංගම්වල අධිකාරී බලයෙහි අවසාන මූලාශ්‍රය වේ.
(4) ස්වභාවික අයිතිවාසිකම් - පාලකයන් විසින් මානවයන්ට ලබා දී ඇති අයිතිවාසිකම් ය.
(5) නීතියේ ආධිපත්‍යය - පාලකයාගේ කැමැත්ත පරිදි නීති වෙනස් කරන ක්‍රමයකි. (......)

**12.** සමාජ සම්මුති න්‍යායට අනුව, රාජ්‍යය
(1) සිවිල් සමාජයට ද්විතීයික ය.
(2) ඓතිහාසික විකාශනයක ප්‍රතිඵලයකි.
(3) ජනතාව අතර ඇතිවන එකඟත්වයක ප්‍රතිඵලයකි.
(4) දෙවියන්ගේ නිර්මාණයකි.
(5) ජනතාවගේ අභිලාෂයන් ඉටුකිරීමට අපේක්ෂා නොකරයි. (......)

**13.** පහත සඳහන් යුගල අතුරින් චින්තකයා සහ ඔහුගේ දේශපාලන අදහස නිවැරදි ව ගළපා ඇති යුගලය කුමක් ද?
(1) ඇරිස්ටෝටල් - "මිනිසා ස්වභාවයෙන්ම දේශපාලන සත්ත්වයෙකි."
(2) ඒ.වී. ඩයිසි - "බලය දූෂණයට නැඹුරු වන අතර පරම බලය නියත ලෙසින්ම දූෂණය සිදු කරයි."
(3) ජෝන් ලොක් - "අරාජිකත්වයට සහ අක්‍රමවත්භාවයට ඇති එක ම විකල්පය පරම බලැති ආණ්ඩුවයි."
(4) ජීන් බෝඩෑන් - "පුරවැසියන්ට ජීවිතය, නිදහස, දේපළ පිළිබඳ ස්වභාවික අයිතිවාසිකම් හිමි ය."
(5) මොන්ටෙස්ක්‍යු - "නීතියේ පාලනයක් මිස මිනිසුන්ගේ පාලනයක් නොවේ." (......)

**14.** පහත සඳහන් රටවල් පසෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ කුමක් ද?
(1) ස්විට්සර්ලන්තය අර්ධ සංඝීය ලක්ෂණ සහිත සංඝීය රාජ්‍යයකි.
(2) ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින් ම පදනම් වන්නේ සම්භාව්‍ය සංඝීය මූලධර්ම මත ය.
(3) අමෙරිකා එක්සත් ජනපද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නම්‍ය වන අතර පහසුවෙන් වෙනස් කළ හැකි ය.
(4) සම්ප්‍රදායයන් එක්සත් රාජධානියෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ප්‍රධාන ලිඛිත අංගයකි.
(5) වර්තමාන ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රංශය ඒකීය රාජ්‍යයක් බව පැහැදිලිව සඳහන් නොකරයි. (......)

**15.** පහත සඳහන් ඒවායින් රාජ්‍ය ප්‍රතිපත්තියේ ලක්ෂණයක් වන්නේ කුමක් ද?
(1) එයට බලපෑම් කරනුයේ දේශපාලන පක්ෂවලින් පමණි.
(2) එය ආණ්ඩුවේ අහඹු තීරණ සමූහයකි.
(3) එය සකස් කර ඇත්තේ සමාජ ගැටලු විසඳීමට ය.
(4) එය යොදාගනු ලබන්නේ ව්‍යාපාරික සංවිධානවලට පමණි.
(5) එය සැමවිට ම පෞද්ගලික අභිලාෂ නියෝජනය කරයි. (......)

**16.** ගැටුම් කළමනාකරණය යන සංකල්පය වඩාත් හොඳින් විස්තර කරනුයේ පහත සඳහන් කුමකින් ද?
(1) ගැටුම විසඳීමට උත්සාහ කරයි.
(2) ගැටුම සම්බන්ධ පාර්ශ්වයන් අතර සහයෝගීතාවය සහ සම්මුතිය අධෛර්යමත් කරයි.
(3) ගැටුමේ මූලික හේතු නොසලකා හරියි.
(4) ගැටුමේ සෘණාත්මක බලපෑම් අවම කිරීමට අවධානය යොමුකරයි.
(5) සැමවිට ම එක් පාර්ශ්වයක අභිලාෂ ප්‍රවර්ධනය කරයි. (......)

**17.** පහත සඳහන් ඒවායින් ජාතික බලයෙහි මූලිකාංගයක් වන්නේ කවරක් ද?
(1) ජාත්‍යන්තර සදාචාරය (2) පරිසරය (3) සිවිල් සමාජය
(4) හමුදාව (5) මහජන මතය (......)

[ඉතිරි පිටුව බලන්න

PAST PAPERS WIKI



Scanned with CamScanner
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki

18. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව පිළිබඳ කුමන ප්‍රකාශය නිවැරදි ද?
   (1) පාර්ලිමේන්තුව එහි ව්‍යවස්ථාදායක කාර්යයන් සම්බන්ධයෙන් රජුට වගකිව යුතු ය.
   (2) පාර්ලිමේන්තුව නීත්‍යානුකූලව උත්තරීතර වේ.
   (3) කිරීටය තවදුරටත් පාර්ලිමේන්තුවේ කොටසක් නොවේ.
   (4) මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර ගනු ලබන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය මගිනි.
   (5) මන්ත්‍රී මණ්ඩල දෙකට ම නීති සම්පාදනය සම්බන්ධයෙන් සමාන බලතල ඇත. (......)

19. පහත සඳහන් ආණ්ඩු අතුරෙන් නොබැඳි ව්‍යාපාරය සමග සුහදශීලී සබඳතාවයක් පවත්වා ගත්තේ කවර ආණ්ඩුව ද?
   (1) ඩී. එස්. සේනානායක ආණ්ඩුව (1947 - 1952)
   (2) සර් ජෝන් කොතලාවල ආණ්ඩුව (1953 - 1956)
   (3) සිරිමාවෝ බණ්ඩාරනායක ආණ්ඩුව (1970 - 1977)
   (4) ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුව (1977 - 1989)
   (5) රණසිංහ ප්‍රේමදාස ආණ්ඩුව (1989 - 1993) (......)

20. බහුජාතික සමාගම් (Multi-National Corporations) යනු
   (1) මූලික වශයෙන් ගෝලීය මට්ටමින් වෙළෙඳාම් සහ ව්‍යාපාරවල නියැලී සිටින බලවත් සමාගම් ය.
   (2) ගෝලීය මට්ටමින් මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින බවට ප්‍රකට සමාගම් ය.
   (3) දේශගුණික විපර්යාස අවම කිරීමට ක්‍රියාකරන සමාගම් ය.
   (4) දෙවන ලෝක යුද්ධයෙන් පසුව මතු වූ බලගතු ආරක්ෂක කඳවුරකි.
   (5) සංවර්ධනය වෙමින් පවතින රටවල ජාතිය ගොඩනැගීමේ කටයුතුවලට ක්‍රියාකාරීව යෙදී සිටින සමාගම් ය.
   (......)

- අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21. බ්‍රිතාන්‍ය පාලන අවධියෙහි ලංකාව තුළ
   A - ආණ්ඩුවේ මහජන පදනම් ක්‍රමයෙන් පුළුල් විය.
   B - ඉංග්‍රීසි උගත් බටහිරකරණය වූ මධ්‍යම පංතියක් බිහි විය.
   C - ස්වාධීන අධිකරණ ක්‍රමයක් වර්ධනය විය.
   D - පොදු පරිපාලන ක්‍රමයක් වර්ධනය විය.
   E - ආර්ථික කටයුතුවලට ආණ්ඩුවේ මැදිහත්වීමේ ප්‍රතිපත්තිය නතර කරලී ය.
   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

22. ඩොනමෝර් පාලන අවධිය (1931 - 1947) තුළ
   A - සමාජ සුබසාධනය සඳහා වන වියදම් සැලකිය යුතු ලෙස වැඩි විය.
   B - සමාජීය හා කාර්මික නීති සැලකිය යුතු ප්‍රමාණයක් අලුතෙන් හඳුන්වා දෙනු ලැබිණි.
   C - ලාංකික ඇමැතිවරු ක්‍රමයෙන් වඩා බලවත් වූහ.
   D - දේශපාලන පක්ෂ වර්ධනය වී හොඳින් ස්ථාපිත විය.
   E - ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල කාර්යයන් පුළුල් විය.
   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

23. සෝල්බරි කොමිෂම විසින් පිහිටුවීමට නිර්දේශ කළේ
   A - මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද පනතක් නිශේධනය කිරීමේ බලය සහිත දෙවන මණ්ඩලයකි.
   B - අගමැතිවරයා විසින් දරනු ලබන ආරක්ෂක හා බාහිර කටයුතු අමාත්‍යාංශයකි.
   C - සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත රාජ්‍ය සේවා කොමිෂමකි.
   D - බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාසයන් ය.
   E - අධිකරණ සේවා කොමිෂන් සභාවකි.
   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

[පෙරළිය බලන්න]



Scanned with CamScanner

24. ශ්‍රී ලංකාවේ 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බැහැර වූ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලක්ෂණ කිහිපයක් වූයේ

A - රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම ඇතුළත් කිරීම.

B - ජාතික රාජ්‍ය සභාවේ උත්තරීතරභාවය තහවුරු කිරීම.

C - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය පිහිටුවීම.

D - මූලික අයිතිවාසිකම් සහ නන්වැදෑරුම් නිදහස ඇතුළත් කිරීම.

E - නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීම.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

25. 1947-1972 අතර කාලය තුළ ශ්‍රී ලංකාවෙහි

A - රාජ්‍ය නායකයා වූයේ බ්‍රිතාන්‍ය කිරීටය ය.

B - දේශපාලන ක්‍රමය ක්‍රියාත්මක වූයේ වෙස්ට්මින්ස්ටර් කැබිනට් ආකෘතිය තුළ ය.

C - ප්‍රධාන දේශපාලන පක්ෂ දෙක වූයේ එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ය.

D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක් නොවී ය.

E - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය නොවී ය.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 26. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 14 වන සංශෝධනය මගින් වර්තමාන මැතිවරණ ක්‍රමයට ජාතික ලැයිස්තු ක්‍රමය හඳුන්වා දෙන ලදී. | එක් එක් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම විසින් ලබාගත් ජාතික ඡන්ද අනුපාතය පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසිනව දෙනෙකු පත් කරනු ලබයි. | (......) |
| 27. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 17 වන සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ බලතල සම්බන්ධයෙන් සීමිත සංවරණ සහ තුලන ක්‍රමයක් ඇති කෙරිණි. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 18 වන සංශෝධනය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව අඛණ්ඩව පවත්වාගෙන ගියේ ය. | (......) |
| 28. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පනතක් සම්මත වීමට පෙර එහි ව්‍යවස්ථානුකූලභාවය අභියෝගයට ලක් කළ හැකි ය. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නීති විවරණය පිළිබඳ පූර්ණ අධිකරණ බලය හඳුන්වා දුන්නේ නැත. | (......) |
| 29. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 13 වන සංශෝධනය යටතේ පළාතක ආණ්ඩුකාරවරයා පත්කරනු ලබන්නේ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විසිනි. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනයට අනුව පළාත් ආණ්ඩුකාරවරයා ජනාධිපතිවරයාව නියෝජනය කරයි. | (......) |
| 30. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 19 වන සංශෝධනය යටතේ පාර්ලිමේන්තුවේ නිල කාලයෙන් වසර දෙකක් ඉක්ම වූ පසුව එය විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට හැකි විය. | ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත් නීති බවට පත්වන්නේ ජනාධිපතිවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසුව ය. | (......) |

[තුන්වැනි පිටුව බලන්න



Scanned with CamScanner

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න